ත්‍රිපිටක ධර්මය - 4 ශ්‍රේණිය
මූලික පිරිවෙණ - ගුරු මාර්ගෝපදේශය
2019/S/4/පිරි/TG/11-04/1700

ISBN 978-955-25-0513-3
P01
2010406
TG PIRI: TRIPITAKA - GR 4
Rs. 160.00

4 ශ්‍රේණිය ත්‍රිපිටක ධර්මය ගුරු මාර්ගෝපදේශය

# ත්‍රිපිටක ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## මූලික පිරිවෙණ

## 4 ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ත්‍රිපිටක ධර්මය

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

## හතරවන ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ත්‍රිපිටක ධර්මය**
මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය
4 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0513-3

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

මුද්‍රණය: එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධන තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක් වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ප්‍රමුඛ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උරදිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීනව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රම ශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජන කර ගැනීමටත් විෂය මාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අභියෝයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශ, ඔබට මහගු පිටුවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රම ශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමථාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තත් ක්‍රියාකාරකම් පදනම් කරගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂය මාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවන් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුවයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එකම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනයයි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දයකත්වයක් නොතිබුණි.

පිරිවෙන් අංශයක්/ දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමැතිතුමන් 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No. 5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායකවීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපාන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදුතාව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කරගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙනෙහි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් සමයාන්තර ඥාණයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥාණයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥාණයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදනය කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුන ද පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙනට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදු කරන්නට ලැබීම පිළිබඳ ව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් එලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස් ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය සම්බන්ධීකරණය විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

# විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය :**

ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම :**

**ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ, (පිරිවෙන්) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**අධීක්ෂණය :**

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය :**

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය,
ජාතික අධ්‍යාපන ආයතනය

**පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය :**

**පූජ්‍ය උඩුගම සුදස්සි හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දෙපාර්තමේන්තු ප්‍රධානි, ආගම් හා සාරධර්ම අධ්‍යාපන
දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය :**
**මහාචාර්ය දේශප්‍රිය ගුණසේන**
පාලි බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :**

**පූජ්‍ය මාදෝවිට වජිරබුද්ධි හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය

**පූජ්‍ය මැටිබැඹියේ ධම්මසිරි හිමි**
සහය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ
**පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

**පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි**
පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරී කොළඹ දිස්ත්‍රික්කය

**පූජ්‍ය ලේල්වල තපස්සි හිමි**
පරිවේණාධිපති පරමධම්මචේතිය මහ පිරිවෙණ, රත්මලාන

**පූජ්‍ය උඟුරුගමුවේ අස්සජි හිමි**
පරිවේණාචාර්ය කළු/ ශ්‍රී ගංගාතිලක මූලික පිරිවෙණ, කෙසෙල්වත්ත, පානදුර

**පී.ඒ. සරත් කුමාර**
පරිවේණාචාර්ය කො/ තක්ෂිලා මහ පිරිවෙණ, කඩුවෙල

**භාෂා සංස්කරණය:**

**පූජ්‍ය තණබද්දේගම සෝභිත හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් :**

**ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ**
පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**විවිධ සහාය :**

**පී.ජී. බුද්ධිකා කරුණාරත්න**
කළමනාකරණ සේවා නිළධාරි, අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටකවරය නිර්මාණය :**

**ජේ. එම්. තරිඳු හසංග**
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විද්‍යාව හා තොරතුරු තාක්‍ෂණය), පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් ප්‍රතිඵල සම්පන්න භික්ෂු පරපුරක් නිර්මාණය කිරීම ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ පරමාර්ථයයි. ශාක්‍යමුනීන්ද්‍ර ගෞතම බුදුරජාණන් වහන්සේ මෙලොවට දායාද කළ නෛර්යාණික ශ්‍රී සද්ධර්මය අධ්‍යාත්මය සුවපත් කරලීම උදෙසා පවත්වාගෙන යාමේ මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය උදෙසා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය ප්‍රබල දායකත්වයක් සපයයි.

පිරිවෙන් අධ්‍යාපනය වඩාත් ඵලදායී හා ගුණාත්මක අර්ථ පූර්ණ භාවයට පත් කරලීම උදෙසා වර්තමාන අධ්‍යාපන ප්‍රවාහය තුළ ක්‍රියාත්මක නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දී ඇත. ඒ අනුව විෂයමාලා ප්‍රතිසංස්කරණය සිදු කර පරිවේණාචාර්යවරුන්ට අවශ්‍ය පහසුකම් සලසා දීමට ක්‍රියාකර ඇත. එයට අදාළ විෂය නිර්දේශය පෙළපොත සම්පාදනයෙන් අනතුරුව ගුරු මාර්ගෝපදේශය සකස් වන්නේ ඵලදායී බව තවත් වැඩිකර ගැනීමේ අරමුණ පෙරදැරි කොට ගෙනයි.

ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධානතම විෂය ධාරාව වන්නේ ත්‍රිපිටක ධර්මයයි. ත්‍රිපිටක අධ්‍යාපනයෙන් තොරව භික්ෂු අධ්‍යාපනය සාර්ථකත්වය කරා පියමැනිය නොහැක. සූත්‍ර, විනය, අභිධර්මය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් වර්තමාන භික්ෂූන් වහන්සේ ලබා ගැනීම යුගයේ අවශ්‍යතාවක් ද වෙයි. සම්බුද්ධ ශාසනය විෂයෙහි එල්ලවන නොයෙක් අභියෝග ජය ගැනීමට ඇති එක ම විසඳුම වන්නේ භික්ෂූන් වහන්සේ ප්‍රතිබල සම්පන්න වීමයි.

ත්‍රිපිටක ධර්මය විෂය භාර ගුරු භවතා දැඩි වගකීමෙන් යුතු ව ක්‍රියා කරන්නේ නම් යථෝක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉතා පහසු ය. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම මෙන් ම නූතන අධ්‍යාපන ක්‍රමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් අපේක්ෂිත ඉලක්කයන් කරා ශිෂ්‍ය ප්‍රජාව මෙහෙයවීම ඔවුන්ගේ වගකීමක් බව ද අවධාරණය කරමි.

ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයාණන් වහන්සේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම සරල ය. ප්‍රායෝගික ය. අවස්ථෝචිත ය. තමන් වහන්සේ හමුවට පැමිණෙන තැනැත්තාගේ මානසික ස්වභාවය හඳුනාගෙන ඊට අවශ්‍ය මාර්ගෝපදේශ සලස්වාදීමට බුදුරජාණන් වහන්සේ ක්‍රියාකළ අන්දම සූත්‍ර දේශනාවන් පරිශීලනය කරන විට මෙන් ම සම්බුද්ධ චරිතය හදාරන විට අපට මැනවින් පසක් වේ.

නූතන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළින් ද ගුරුවරයා ශිෂ්‍යයාට මාර්ගෝපදේශකයකු ලෙස ඉගෙනුම් අවස්ථා හා පරිසර නිර්මාණය කරදීමට දක්ෂයකු විය යුතු බව අවධාරණය කර ඇත. ත්‍රිපිටක ධර්මය විෂය, විෂය දැනුමින් එහා ගිය පුද්ගල ආධ්‍යාත්මය සංවර්ධනය ඉලක්ක කර ගත් දාර්ශනික ප්‍රවාහයකි. විෂය ක්ෂේත්‍ර වශයෙන් ගත් කළ පුද්ගලයාගේ සීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂා වර්ධනය උදෙසා අවශ්‍ය මාර්ගෝපදේශ ත්‍රිපිටකය තුළින් මනාව විග්‍රහ වී ඇත.

පිරිවෙන් ත්‍රිපිටක ධර්මය විෂයමාලාව සකස් කිරීමේ දී එම සියලු ක්ෂේත්‍ර පරිශීලනය කිරීමට අවශ්‍ය මූලික දැනුම අන්තර්ගත කිරීමට අප උත්සාහ දරා ඇත.

බුද්ධ චරිතය, චරිත කතා, විනය, සූත්‍ර, අභිධර්මය, ධම්ම පදය, භාවනා, මූලික ධර්ම කරුණු, බෞද්ධ සමාජ හා සංස්කෘතිය, ශාසනික චර්යා හා වත් පිළිවෙත් ආදි ක්ෂේත්‍ර හරහා නවක භික්ෂුවකට සිය භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා වන මග පෙන්වීම් ලබා දීමට හැකි වී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී මෙහි ඇතුළත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය ඔබේ ඉගැන්වීම් ක්‍රමයට පහසුවක් වනු ඇත. මෙහි යෝජනා කර ඇති පාඩම් සැලසුම් එලෙසින් ම භාවිත කිරීම අනිවාර්ය නොවන අතර එය මග පෙන්වීමක් බව සලකන්න. ඔබේ ප්‍රදේශයේ, පිරිවෙන් සංස්කෘතියේ මෙන් ම ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව එය ගැළපෙන ලෙස භාවිත කළ හැකි ය. එහෙත් මෙම ගුරු මාර්ගෝපදේශය යෝජනා කර ඇති නිපුණතා හා නිපුණතා මට්ටම් වෙනස් නොකළ යුතු බව අවධාරණය කරමි. පන්තියට අදාළ පෙළපොත ද භාවිත කරමින් ඉගෙනුම් ඵල සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කොට පාඩම් අවසානයේ දී එම නියමිත ඉගෙනුම් ඵල ඔස්සේ නිපුණතා මට්ටමට ළඟාවීම අපේක්ෂා කෙරේ. එසේ නිපුණතා මට්ටම් කීපයක් මගින් නිපුණතාවට ශිෂ්‍යයා මෙහෙයවිය යුතු ය.

ඔබගේ නව නිර්මාණ හා අදහස් ද එක්කොට ගනිමින් ප්‍රාදේශීය වශයෙන් හෝ ඔබ පිරිවෙණට ආවේණික සංස්කෘතියට අනුව පාඩම් සැලසුම් සකස්කොට ගන්න. එහි දී වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ භාවිත වන නවීන තාක්ෂණික මෙවලම් ද ඔබ හැකි තරම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන්න. එහි දී ත්‍රිපිටක ධර්ම විෂයයට එම උපකරණ ගැළපේ දැයි සිතන්න. උපකරණ භාවිතයේ දී බෞද්ධ සංස්කෘතියට හෝ ආගමික වටපිටාවට හෝ ශිෂ්‍ය විනය ට හානි නොවන ලෙස භාවිතයට කටයුතු කරන්න.

පාඩම ආරම්භයේ දී ආකර්ෂණීය මෙන් ම ප්‍රබෝධාත්මක පිවිසීම් භාවිත කිරීම වැඩි ප්‍රතිඵල ලැබීමට රුකුලක් වනු ඇත. පාඩම් සංවර්ධනයේ දී භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් හැකි උපරිමයෙන් භාවිත කරන්න. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබ පන්ති කාමරයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරමින් පාඩම් සංවර්ධනය කිරීම වැඩි ප්‍රතිඵලදායක බව අවධාරණය කරමි.

ත්‍රිපිටක ධර්මය විෂය සාර්ථකව ශිෂ්‍යයා වෙත වෙත යොමු කිරීම අප සතු යුතුකමකි. ඒ සඳහා ශිෂ්‍යයා මැනවින් තේරුම් ගෙන ඊට ගැළපෙන ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීම අඛණ්ඩව කළ යුතු ය. අදාළ නිපුණතා මට්ටමට ළඟාවීමට අවශ්‍ය තක්සේරු හා ඇගයීම් නිර්ණායක සකස් කොට ඇගයීමට ලක් කරමින් අපහසුතා දක්වන සිසුන් වෙතොත් නැවත නැවත ඇගයීමට ලක් කරමින් නිපුණතා මට්ටමට ළඟා වන්න. ශිෂ්‍යයාට දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කර සටහන් තබන්න. සෑම පාඩමක් අවසානයේ දී ම හැකි තරම් අභ්‍යාසවල ශිෂ්‍යයින් යොමු කිරීමට කටයුතු කරන්න. ශිෂ්‍යයාට වැඩිදුර ප්‍රායෝගික අවස්ථා ලබා දී මෙය නිපුණතාවට ළඟාවීමට හැකි බව සිතන්න.

ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී ගුරු භවතුන් මෙකී කරුණු පිළිබඳ දැඩි අවධානය යොමු කොට ශාසනික චර්යාවෙන් ද ආකල්ප සම්පත්තියෙන් ද දැනුමෙන් ද පරිපූර්ණ ශිෂ්‍ය පිරිසක් උදෙසා තම මගපෙන්වීම ලබාදීම අගය කොට සලකමි.

පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දෙපාර්තමේන්තු ප්‍රධානී
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


| | |
|---|---|
| ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය | iii |
| අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවුඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix-x |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xi-xii |
| ජාතික අරමුණු | xv |
| මූලික නිපුණතා | xvi-xvii |
| ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු | xviii |
| වාර නියමය | xix |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xx |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය | xxx |
| 1. වඳිමි මුනි උතුමන් තිලෝගුරු | 1-2 |
| 2. මම නමදිමි සදහම් පහදා සිතු | 3-4 |
| 3. වඳිම් මහ සඟන මුනි නන්දන | 5-6 |
| 4. බුද්ධකාලීන මහා ශ්‍රාවක ශ්‍රාවිකා චරිතාදර්ශ | 7-8 |
| 5. සසුන එකලු කළ නූතන යතිවරු | 9-10 |
| 6. පරමාදර්ශී උපාසක උපාසිකා චරිත හඳුනා ගනිමු | 11-12 |
| 7. සම්බුදු සසුනෙහි ආයුෂය විනය යි | 13-14 |
| 8. සසුන් කෙත සරු කරන උපසම්පදාව | 15-16 |
| 9. සඟ සසුනේ පාලනය - පැවිදි උපෝසථය | 17-18 |
| 10. අමතක වන්නට නොදිය යුතු කරුණු (පඨම සාරාණීය සූත්‍රය) | 19-20 |
| 11. තමන් හැදී අනුන් හදන භික්ෂුව (ධම්මඤ්ඤූ සූත්‍රය) | 21-22 |
| 12. ජංගම නිධානය (නිධිකණ්ඩ සූත්‍රය) | 23-24 |
| 13. ගිහියාගේ දියුණුව (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය) | 25-26 |

14. සිතුවිලි හඳුනා ගැනීම හා අන්‍ය සමාන චෛතසික 27-28

15. නරක සිතුවිලි 29-30

16. හොඳ සිතුවිලි 31-33

17. අනුවණයා හා අසත්පුරුෂයා (බාල වග්ගය) 34-36

18. සත්පුරුෂයා (පණ්ඩිත වග්ගය) 37-38

19. කෙලෙසුන් නැසූ උතුමෝ 39-42

20. කමටහන් උගනිමු (සම සතළිස් කර්මස්ථාන) 43-45

21. සිත එකඟ කරන හැටි 46-48

22. බුදුමග පහන් එළි 49-51

23. ලෝකයේ ප්‍රධාන ලක්ෂණ තුන 52-53

24. සසර බැඳ තබන බැම් දහය 54-55

25. බුදුන් දවස දඹදිව වෙනස 56-57

26. සාසන සංවිධාන සමුළු තුන 58-59

27. බුදු සසුන රජ හසුන කළ අධිරජ 60-61

28. භික්ෂූන් වහන්සේගේ ආගමික මෙහෙවර 62-63

29. බුදු දහමින් හැදී වැඩුණු සිංහලය 64-65

30. ලොවට වඩන මෙත හා සතට සදන සෙත 66-67

ත්‍රිපිටක ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව 68-69

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව ඇගයීම්වලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ දැනුම, ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

**i. සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| **සාක්ෂරතාව** | : | සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම |
| **සංඛ්‍යා පිළිබඳ දැනුම** | : | භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| **රූපක භාවිතය** | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

**ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

**iii. පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

| | | |
|---|---|---|
| **සමාජ පරිසරය** | : | ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

## iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

## v. ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

## vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

## vii. ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදීව කටයුතු කරන, නිවැරැදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන භික්ෂු හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරැදි යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගීකොටගෙන සිව්වණක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කොට ගත් දූහැමි පරපුරකට මඟ පෙන්වීම.

3. නිවැරැදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමට භික්ෂු විනය හා ශික්ෂාපද ප්‍රගුණ කිරීමට මඟ පෙන්වීම.

4. බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනයෙන් භික්ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනගා ගැනීමටත් මඟ පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයනයකොට ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ගිහි ජීවිත සාර්ථක කර ගැනීමට ධර්ම දේශනා කිරීමටත් මඟ පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික උරුමය හැඳින, ශාසනික උරුමය රැකගැනීමත්, ඒවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගීකොට ගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමටත්, ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් අවශ්‍ය ශක්තිය ලබාදීම.

# වාර නියමය - 4 ශ්‍රේණිය

| නිපුණතා මට්ටම / පාඩම | | කාලපරිච්ඡේද |
|---|---|---|
| 1 වාරය | 1.1 - 1 පාඩම<br>2.1 - 4 පාඩම<br>3.1 - 7 පාඩම<br>4.1 - 10 පාඩම<br>4.2 - 14 පාඩම<br>5.1 - 17 පාඩම<br>6.1 - 20 පාඩම<br>7.2 - 23 පාඩම<br>8.1 - 25 පාඩම | 60 |
| 2 වාරය | 1.1 - 2 පාඩම<br>2.1 - 5 පාඩම<br>3.1 - 8 පාඩම<br>4.1 - 11,12 පාඩම්<br>4.2 - 15 පාඩම<br>5.1 - 18 පාඩම<br>6.2 - 21 පාඩම<br>7.3 - 24 පාඩම<br>8.2 - 26 පාඩම<br>9.1 - 29 පාඩම | 60 |
| 3 වාරය | 1.1 - 3 පාඩම<br>2.2 - 6 පාඩම<br>3.2 - 9 පාඩම<br>4.1 - 13 පාඩම්<br>4.2 - 16 පාඩම<br>5.1 - 19 පාඩම<br>7.1 - 22 පාඩම<br>8.3 - 27 පාඩම<br>8.4 - 28 පාඩම<br>9.1 - 30 පාඩම | 60 |

සැලකිය යුතුයි : පෙළ පොතේ පාඩම් පිළිවෙලට අනුව නිපුණතා පෙළගස්වා ඇත.

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින, චරිතායනය කරයි. | 1.1 තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි. | නව අරහාදී බුදු ගුණ, සයවැදෑරුම් දහම් ගුණ, නව වැදෑරුම් සඟ ගුණ. | • තෙරුවන් ගුණ විස්තර කරයි.<br>• ත්‍රිවිධ රත්නයේ ගුණ වෙන් වෙන් ව විස්තරකර ඇති බව පිළිගනියි.<br>• ත්‍රිවිධ රත්නයේ ගුණ වගුගත කරයි.<br>• ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.<br>• අවබෝධයෙන් කටයුතු කරයි. | 21 |
| 2.0 භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කරගනියි. | 2.1 ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලින් පැහැදිලි වන ගුණාංග ආදර්ශ කොටගෙන තම ජීවිතය සාර්ථක කරගනියි. | මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, පටාචාරා තෙරණිය, සසුන එකලු කළ නූතන යතිවරු (හික්කඩුවේ සුමංගල නාහිමි, රත්මලානේ ධම්මාලෝක නාහිමි, හේන්පිටගෙදර ඥානසීහ නාහිමි, රේරුකානේ චන්දවිමල නාහිමි) | • දුෂ්කර ක්‍රියාවෙහි සිදුවීම් පැහැදිලි කරයි.<br>• ජීවිතයේ සැබෑ තතු සතර පෙරනිමිතිවලින් හෙළිවන බව පිළිග නියි.<br>• දුෂ්කර ක්‍රියාවෙහි වැදගත් සිදුවීම් වගු ගත කරයි.<br>• උත්සාහයෙන් කටයුතු කරයි.<br>• නිවැරදි මාවත තෝරා ගනියි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2. උපාසක උපාසිකා චරිත අධ්‍යයනය කර, තම චරිතය හැඩගස්වා ගනියි. | සුදත්ත සිටුතුමා, විශාඛා උපාසිකාව, අනගාරික ධර්මපාලතුමා. (සුවිශේෂ ගුණාංග) | • උපාසක උපාසිකා චරිත කිහිපයක් විස්තර කරයි.<br>• උපාසක උපාසිකා චරිත සිව්වණක් පිරිසට අයත් බව පිළිගනියි.<br>• උපාසක උපාසිකා චරිත කිහිපයක් නම්කොට, චරිත සංවර්ධනයට ලබාගත හැකි ආදර්ශ ලැයිස්තුගත කරයි.<br>• අනගාරික ජීවිතයක් ගතකරයි.<br>• අර්ථවත් ජීවිතයක් ගතකරයි. | 07 |
| 3.0 බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගස්වා ගනියි. | 3.1. විනය පිටකයේ ස්වභාවය හැඳින, විනයානුකූල ජීවිතයක් ගතකරයි. | විනය පිටකය හැඳින්වීම, උපසම්පදාව. | • විනය පිටකයේ වැදගත්කම විස්තර කරයි.<br>• සාර්ථක භික්ෂු ජීවිතයකට විනය වැදගත් වන බව පිළිගනියි.<br>• උපසම්පදා විනය කර්මය සිදුකරන ආකාරය පිළිවෙළින් ලැයිස්තුගත කරයි.<br>• දැහැමි ජීවිතයකට හුරුවෙයි.<br>• සිල්වත් ජීවිතයක් ගතකරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2. උපසම්පදා සීලයේ වැදගත්කම හැඳින, සාර්ථක භික්ෂු ජීවිතයක් ගතකරයි. | උපෝසථ කර්මය. | • උපසම්පදා විනය කර්ම විස්තර කරයි.<br>• උපසම්පදාව භික්ෂු ජීවිතයේ ආයුෂය බව පිළිගනියි.<br>• උපෝසථ කර්ම ලැයිස්තුගත කරයි.<br>• සඟ මහලු පිළිවෙතින් කටයුතු කරයි.<br>• විනයගරුක ජීවිතයකට දායක වෙයි. | 06 |
| 4.0 ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසාගනියි. | 4.1. නිකායාගත සූත්‍ර දේශනාවලට ඇතුළත් දහම් කරුණු ඉගෙන, ආදර්ශයෙන් කටයුතු කරයි. | පඨම සාරාණීය සූත්‍රය, ධම්මඤ්ඤු සූත්‍රය, නිධිකණ්ඩ සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය. | • අංගුත්තර නිකායට අයත් සූත්‍ර කිහිපයක් විස්තර කරයි.<br>• සූත්‍ර දේශනා මගින් දහම් කරුණු විස්තර කෙරෙන බව පිළිගනියි.<br>• පඨම සාරාණීය, ධම්මඤ්ඤු, නිධිකණ්ඩ, ව්‍යග්ඝපජ්ජ යන සූත්‍රවල ඇතුළත් දහම් කරුණු වෙන් වෙන්ව වගුගත කරයි.<br>• සූත්‍ර දේශනා අධ්‍යයනය කරයි.<br>• ධර්මය පවත්වාගෙන යාමට දායක වෙයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2. අභිධර්ම පිටකයට අයත් චෛතසික පරමාර්ථය අධ්‍යයනය කර, අවබෝධයෙන් කටයුතු කරයි. | චෛතසික පරමාර්ථය | ● අභිධර්ම පිටකයට අයත් චෛතසික පරමාර්ථය විස්තර කරයි.<br>● අභිධර්මයෙහි ධර්ම කරුණු ගැඹුරින් විස්තර කර ඇති බව පිළිගනියි.<br>● චෛතසික පරමාර්ථය ලැයිස්තුගත කරයි.<br>● දහම් පොතපත පරිශීලනය කරයි.<br>● ජීවිතය පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරයි. | 15 |
| 5.0 බෞද්ධ ශික්ෂා පද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර, ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි. | 5.1. ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරමින්, ධර්ම අනුශාසනයෙහි යෙදෙයි. | බාලවග්ගය, පණ්ඩිතවග්ගය, අරහන්ත වග්ගය. | ● ධම්මපද ගාථාවන්හි අර්ථ, නිරුක්ති පැහැදිලි කරයි.<br>● ධම්මපද ගාථා ජීවිතාදර්ශ සපයන බව පිළිගනියි.<br>● බාල වග්ගය, පණ්ඩිත වග්ගය හා අරහන්ත වග්ගයෙහි එන ගාථා ලැයිස්තු ගත කර, ආදර්ශ වගුගත කරයි.<br>● පඬිවරයෙකු ලෙස කටයුතු කරයි.<br>● බාල (පහත්) කටයුතුවලින් මිදෙයි. | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 6.0 බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින්, යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි. | 6.1. සම සතළිස් කර්මස්ථාන අධ්‍යයනයකර, අවබෝධයෙන් කටයුතු කරයි. | සම සතළිස් කර්මස්ථාන, දස අනුස්සති (ධර්ම, සංඝ, සීල, දේවතා අනුස්සති) | • සම සතළිස් කර්මස්ථාන විස්තර කරයි.<br>• සම සතළිස් කර්මස්ථාන වැඩීමෙන් චිත්ත ඒකාග්‍රතාව ඇතිවන බව පිළිගනියි.<br>• සම සතළිස් කර්මස්ථාන අතරින් ධම්ම, සංඝ, සීල, දේවතා අනුස්සති පිළිබඳ විස්තර ලැයිස්තුගත කරයි.<br>• චිත්ත ඒකාග්‍රතාව ඇතිකර ගනියි.<br>• නිවැරදි සිහියෙන් කටයුතු කරයි. | 06 |
| | 6.2. සමථ භාවනාව විධිමත්ව අධ්‍යයනය කර, තම ජීවිතය සාර්ථක කරගනියි. | සමථ භාවනාව. | • සමථ භාවනාව සිදු කරන ආකාරය පැහැදිලි කරයි.<br>• චිත්ත ඒකාග්‍රතාව, සාර්ථක ජීවිතයකට මග සැලසෙන බව පිළිගනියි.<br>• සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල ලැයිස්තුගත කරයි.<br>• නිවැරදි කාය, වාග්, මනෝ කර්මයෙන් යුතුව කටයුතු කරයි.<br>• සදාචාරවත් ජීවිතයකට මග සලසා ගනියි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 7.0 බුදුසමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මක ව අධ්‍යයනය කර, සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව ලෝක ධර්මතා හමුවේ නොසැලී ක්‍රියාකරයි. | 7.1. මූලික බෞද්ධ ඉගැන්වීම්වල සුවිශේෂ බව අධ්‍යයනය කර, අවබෝධයෙන් කටයුතු කරයි. | චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය, පටිච්චසමුප්පාදය, කර්මය, පුනර්භවය. (මූලික පැහැදිලි කිරීමක්) | • බුදුදහමේ මූලික ඉගැන්වීම් පැහැදිලි කරයි.<br>• බුදුදහමේ මූලික ඉගැන්වීම් තුළින් දහම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදෙන බව පිළිගනියි.<br>• බුදුදහමේ මූලික ඉගැන්වීම්වලට උදාහරණ දක්වමින් ඒවා ලැයිස්තුගත කරයි.<br>• ජීවන ගැටලු විශ්ලේෂණාත්මකව විග්‍රහකොට විසඳා ගනියි.<br>• අභියෝග ජය ගනියි. | 07 |
| | 7.2. බෞද්ධ ත්‍රිලක්ෂණ ධර්මය හඳාරා, අවබෝධයෙන් කටයුතු කරයි. | ත්‍රිලක්ෂණ ධර්මය | • බෞද්ධ ත්‍රිලක්ෂණ ධර්මය පැහැදිලි කරයි.<br>• ත්‍රිලක්ෂණ ධර්මය, බුදුදහමේ මූලික ඉගැන්වීමක් බව පිළිගනියි.<br>• ත්‍රිලක්ෂණය, වෙන් වෙන්ව විස්තර කරමින් ලැයිස්තුගත කරයි.<br>• ජීවන ගැටලු හමුවේ යථාවබෝධයෙන් කටයුතු කරයි.<br>• සරල ජීවන පැවැත්මකට හුරුවෙයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3. දස සංයෝජන ධර්මය ඉගෙන, අවබෝධයෙන් කටයුතු කරයි. | දස සංයෝජන. | ● දස සංයෝජන ධර්ම පැහැදිලි කරයි.<br>● දස සංයෝජන ධර්ම ප්‍රහීණ කිරීමෙන් නිර්වාණය ලැබිය හැකිබව පිළිගනියි.<br>● සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ග ඵලාවබෝධය පිණිස දස සංයෝජන ප්‍රහීණ කරන ආකාරය ලැයිස්තුගත කරයි.<br>● අකුසලයෙන් වෙන්වෙයි.<br>● සැදැහැවත් ජීවිතයක් ගතකරයි. | 05 |
| 8.0 ශාසන ඉතිහාසය හැඳින, බෞද්ධ ආගමික වත්පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනියි. | 8.1. බුද්ධකාලීන භාරතීය ආගමික හා සාමාජික තත්ත්වය ඉගෙන, අවබෝධයෙන් කටයුතු කරයි. | බ්‍රාහ්මණ ඉගැන්වීම් (වර්ණ ධර්ම, ස්වධර්ම, ආශ්‍රමධර්ම, ආපද්ධර්ම) ෂඩ්ශාස්තෘවරු පිළිබඳ මූලික කරුණු. | ● ෂඩ් ශාස්තෘවරු පිළිබඳ පැහැදිලි කරයි.<br>● බුද්ධකාලීන භාරතයේ දෙසැටක් මිථ්‍යා දෘෂ්ටික ඉගැන්වීම් තිබූ බව පිළිගනියි.<br>● බ්‍රාහ්මණ ඉගැන්වීම් ලැයිස්තුගත කරයි.<br>● මිථ්‍යා දෘෂ්ටියෙන් තොරව කටයුතු කරයි.<br>● ධාර්මික ජීවිතයක් ගතකරයි. | 05 |
| | 8.2. ථේරවාදී ධර්ම සංගායනාවන්හි ශාසනික වැදගත්කම හැඳින, ජීවිතාදර්ශයෙන් කටයුතු කරයි. | භාරතීය ථේරවාදී සංගායනා තුන (පඤ්චසතිකා, සත්තසතිකා, සාහස්සිකා) | ● භාරතීය ථේරවාදී සංගායනාවන්හි මූලික කරුණු පැහැදිලි කරයි.<br>● ශාසනයෙහි මතු වූ ගැටලු සංගායනා තුළින් විසඳාගත් බව පිළිගනියි.<br>● ථෙරවාදී සංගායනා තුනෙහි මූලික තොරතුරු වගුගත කරයි.<br>● සාකච්ඡා තුළින් ගැටලු විසඳා ගනියි.<br>● සහයෝගයෙන් කටයුතු කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.3. ධර්මාශෝක අධිරාජයාගේ ධර්මදූත සේවය, ශාසන චිරස්ථිතියට බලපෑ බව පිළිගෙන, ධර්මය ආරක්ෂා කිරීමට කටයුතු කරයි. | ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික සේවය. | • ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික සේවය විස්තර කරයි.<br>• ධර්මාශෝක අධිරාජ්‍යයා බුදු දහමේ චිරස්ථිතියට කටයුතුකළ බව පිළිගනියි.<br>• ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික සේවය ලැයිස්තු ගතකරයි.<br>• ශාසනික පැවැත්මට දායකවෙයි.<br>• ශාසනික උරුමය රැකගනියි. | 08 |
| | 8.4 ආගමික වත් පිළිවෙත් පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාසයෙන් යුතුව කටයුතු කරයි. | දේශනා විධි (පරිත්‍රාණ දේශනා, ජාතක දේශනා, දොරකඩ අස්න, යුගාසන දේශනා) | • දේශනා විධි පිළිබඳ පැහැදිලි කරයි.<br>• ආගමික වත් පිළිවෙත් මගින් ශාසනය ආරක්ෂා වන බව පිළිග නියි.<br>• පරිත්‍රාණ දේශනා, ජාතක දේශනා, දොරකඩ අස්න, යුගාසන දේශනා පිළිබඳ තොරතුරු රැස්කරයි.<br>• නිවැරදි වත් පිළිවෙත් අනුගමනය කරයි.<br>• ජීවිතයේ වැදගත් අවස්ථාවල අර්ථාන්විතව කටයුතු කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සමාජ, ආර්ථික, දේශපාලන, සාංස්කෘතික සහජීවනය උදෙසා, බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොටගෙන, ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනියි. | 9.1 බෞද්ධ ඉගැන්වීම් අනුව, භික්ෂු ජීවිතය සාර්ථකකර ගනිමින්, ශාසනික අභිවෘද්ධියෙහි යෙදෙයි. | බුදුදහමින් පෝෂිත හෙළ සංස්කෘතිය, සතර සංග්‍රහවස්තු, සතර බ්‍රහ්මවිහරණ. | • බුදුදහමින් පෝෂිත හෙළ සංස්කෘතිය පැහැදිලි කරයි.<br>• හෙළ සංස්කෘතියක ලක්ෂණ සඳහා බුදුසමය මග පෙන්වූ බව පිළිගනියි.<br>• සතර සංග්‍රහවස්තු, සතර බ්‍රහ්ම විහරණ වෙන් වෙන්ව වගුගත කරයි.<br>• නිවැරදි වත්පිළිවෙත්හි යෙදෙයි.<br>• හෙළ සංස්කෘතිය රැකගනියි. | 09 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1 පාඩම
## වඳිම් මුනි උතුමන් තිලෝගුරු

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**කාලපරිච්ඡේද:-** 10 යි

**ඉගෙනුම්පල:-**

1. නව අරහාදී බුදුගුණ මතකයෙන් කියයි.
2. බුද්ධරත්නයේ ගුණ කොටස් නවයකට ගොනුකොට ඇති බව පිළිගනිමින් කටයුතු කරයි.
3. නව අරහාදී බුදුගුණ සඳහන් කවි තාලයකට ගායනා කරයි.
4. ශ්‍රද්ධාවෙන් බුද්ධ වන්දනාවේ යෙදෙයි.
5. බුද්ධරත්නය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පළමු පාඩම කියවාගෙන එන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- නව අරහාදී බුදුගුණ අතුරෙන් එක් ගුණයක් ප්‍රකට වන සිතුවමක් සහිත පුවරුවක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කර එහි කතා පුවත විස්තර කරන්න.
- එම කතා පුවතින් ඉස්මතුවන බුදුගුණය කුමක් ද? යන්න විමසමින් බුදුගුණ කොටස් නවයකට කැටිකොට ඇතිබව පෙන්වමින් පාඩමට පිවිසෙන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුදුගුණ හැඳින්වීම හා තුනුරුවනට අදාළ ලක්ෂණ පහක් ඇතිබව විස්තර කරන්න. (චිත්තීකතං........යනාදී වශයෙන්)
- එක් කාලච්ඡේදයකට එක් බුදුගුණය බැගින් විස්තර කරන්න.
- ඒ ඒ ගුණයන්ට අදාළ ගාථා හා කවි වණපොත් කරවන්න.
- අරහං ගුණය, සම්මාසම්බුද්ධ ගුණය, විජ්ජාචරණසම්පන්න ගුණය, සුගත ගුණය, ලෝකවිදූ ගුණය, අනුත්තර පුරිසදම්මසාරථී ගුණය, සත්ථාදේවමනුස්සානං ගුණය, බුද්ධ ගුණය, භගවා ගුණය යන බුදුගුණ කාලච්ඡේදයකට එක බැගින් යොදා ඉගැන්වීම් කටයුතුවල යෙදෙන්න.

- මෙම ගුණයන් ඉස්මතුවන චිත්‍ර සිසුන්ට පෙන්වීමට කටයුතු කරන්න.
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක් ලබාදීම හා ශ්‍රද්ධාව ජනිත කිරීම මෙම පාඩමේ අරමුණයි.
- බුදුගුණ පදනම් කරගෙන පුරාතන සම්භාව්‍ය ධර්ම ග්‍රන්ථ පවා රචනා වී ඇති බවත් පැහැදිලි කර දෙන්න.
- ත්‍රිවිද්‍යාව, අෂ්ටවිද්‍යා හා පසළොස්චරණධර්ම යනාදී ගුණයන් බුදුරජාණන් වහන්සේට පැවැති බව පෙන්වා දෙන්න.
- බුදුගුණ භාවනාවක් ලෙස ප්‍රගුණ කළ හැකි බව පැහැදිලි කර දෙන්න.
- එමගින් ශ්‍රද්ධාව වැඩෙන බවත් පැහැදිලි කර දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- අතුලං - කිසි දේකට සමාන නොවන
- ජාගරියානුයෝග - නිතර අවදියෙන් සිටීම (නිදි වැරීම).
- අධිමුක්ති - අවබෝධ කිරීමේ ශක්තිය.
- චිංචිමානවිකා - සියඹලා විකිණූ තරුණිය
- දිට්ඨධම්මික - මෙලොව දියුණුව
- විභජ්ජවාදී - බෙදා දක්වන

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- බුදුගුණ ප්‍රකටවන සිතුවම්.
- පෙළපොතේ පළමුවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා තක්සේරු කරන නිර්ණායකඃ-**

- බුදුගුණයට අදාළ පාලි පාඨය ශබ්ද නගා කියවීම.
- බුදුගුණයට අදාළ බුදුගුණ අලංකාරයේ කවි තාලයකට ගායනා කිරීම.
- එක් එක් බුදුගුණය මතකයෙන් ඉදිරිපත් කිරීම.
- ඒ ඒ ගුණයන්ට අදාළ පාඨ හා කවි පිටපත් කරවීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- වීදාගම මහා මෛත්‍රේය හිමි - බුදුගුණ අලංකාරය
- රේරුකානේ චන්දවිමල මහා නාහිමි - සූවිසි මහා ගුණ

# 2 පාඩම
## මම නමදිම් සදහම් පහදා සිතු

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන් ගුණ හැඳින, චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම්පල:-**

1. සය වැදෑරුම් දහම් ගුණයන්හි අරුත් මතකයෙන් කියයි.
2. දහම් ගුණ පිළිබඳව උද්‍යෝගයෙන් ප්‍රකාශ කරයි.
3. ධර්මයේ ගුණ ඇතුළත් පාඨය තාලයකට සජ්ඣායනා කරයි.
4. ධර්ම රත්නයේ ගුණ මැනවින් හැඳින ආර්ය මාර්ගයේ ගමන් කරයි.
5. ධර්මය පිළිබඳ මිථ්‍යා විශ්වාස බැහැර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- සය වැදෑරුම් දහම්ගුණ ඇතුළත් 02 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- සය වැදෑරුම් දහම් ගුණ සඳහන් ''ස්වාක්ඛාතො.........'' පාඨය සිසුන් සමඟ සජ්ඣායනය කරන්න.
- ඒ පිළිබඳ සාකච්ඡා කරමින් මෙහි දහම් ගුණ ඇතුළත් ව ඇති බව ඉස්මතුකර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ධර්මරත්නයේ ගුණ සයක් ඇති බව පැහැදිලි කරන්න.
- එම ගුණයන් වෙන වෙන ම විස්තර කරන්න.
- පාලියෙන් සඳහන් දහම් ගුණයන්ට අදාළ සිංහල තේරුම් පෙන්වා දෙන්න.
- ස්වාක්ඛාත ගුණය පැහැදිලිකර දෙන්න.
- සන්දිට්ඨික ගුණය පැහැදිලිකර දෙන්න.
- අකාලික ගුණය පැහැදිලිකර දෙන්න.
- ඒහිපස්සික ගුණය පැහැදිලිකර දෙන්න.
- ඕපනයික ගුණය පැහැදිලිකර දෙන්න.
- පච්චත්තං වේදිතබ්බ ගුණය පැහැදිලිකර දෙන්න.
- ත්‍රිපිටකයේ සහ අටුවා ග්‍රන්ථවල දහම්ගුණ සඳහන්ව ඇති බව විස්තර කරන්න.

- ධර්මරත්නය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක් ලබාදීම හා ශ්‍රද්ධාව ජනිත කර ධාර්මික පුද්ගලයෙකු බිහිකිරීමට මඟ පහදන බව පෙන්වා දෙන්න.
- දහම්ගුණ පදනම් කරගෙන පුරාතන සම්භාව්‍ය ධර්ම ග්‍රන්ථ පවා රචනා වී ඇති බවත් පැහැදිලි කර දෙන්න.
- දහම්ගුණ භාවනාවක් ලෙස ප්‍රගුණ කළයුතු බවත් පැහැදිලි කර දෙන්න.
- එමගින් ශ්‍රද්ධාව වැඩෙන බවත් පැහැදිලි කර දෙන්න.
- ධර්මය මැනවින් හැඳින ගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටිය බැහැර කළ හැකි බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප:-**

- විඤ්ඤූහි - නුවණැත්තන් විසින්
- අකාලික - කාලයක් නැතිව ප්‍රතිඵල ගෙන දෙන
- ඔපනයික - පමුණුවාගත යුතු
- පච්චත්තං වෙදිතබ්බො - තම තමන් විසින් වෙන වෙන ම අවබෝධ කළයුතු
- පටිච්ඡන්න - වසා ඇතිවිට
- විරෝචති - බබලයි (ධර්මය බබලන්නේ වැසී ඇතිවිට නොව විවෘතව ඇතිවිටයි)

**ගුණාත්මක යෙදවුම්:-**

- පෙළපෙතේ දෙවන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-**

- දහම් ගුණයට අදාළ පාලි පාඨය ශබ්ද නගා සජ්ඣායනා කිරීම.
- එක් එක් දහම් ගුණය මතකයෙන් ඉදිරිපත් කිරීම.
- ඒ ඒ ගුණයන්ට අදාළ තේරුම් පිටපත් කිරීම.
- දහම්ගුණ ගැන කියවෙන ධම්මචින්තාවක් ඉදිරිපත් කිරීම.

.

**වැඩිදුර පරිශීලනයට:-**

ඇමුණුම් 01. ප්‍රවේශය සඳහා

- ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො ඒහිපස්සිකො ඕපනයිකො පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි
- රේරුකානේ චන්දවිමල මහනාහිමි - සූවිසි මහා ගුණ

# 3 පාඩම
## වඳිම් මහ සඟන මුනි නන්දන

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන්ගුණ හැඳින, චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- තෙරුවන්ගුණ හැඳින චරිතායනය කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම්පල:-**

1. සංඝරත්නයේ ගුණ මතකයෙන් කියයි.
2. සංඝරත්නයේ ගුණ කොටස් නවයකට ගොනුකොට ඇති බව පිළිගනිමින් කටයුතු කරයි.
3. සංඝරත්නයේ ගුණ නවය (09) නිදසුන් සහිතව ඉදිරිපත් කරයි.
4. ඍජු ප්‍රතිපත්තිවල නිරතවෙයි.
5. සිල්වත් භික්ෂු ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- නව වැදෑරුම් සඟගුණ ඇතුළත් තුන් වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- නව වැදෑරුම් සඟගුණ සඳහන් ''සුපටිපන්නෝ.........'' පාඨය සිසුන් සමඟ සජ්ඣායනය කරන්න.
- සංඝරත්නයේ එම ගුණයන් පිළිබඳ සාකච්ඡා කරමින් සඟගුණ යන මාතෘකාව ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සංඝරත්නයේ ගුණ හඳුන්වන්න.
- සංඝරත්නයේ ගුණ නවයක් ඇති බව පැහැදිලි කරන්න.
- එම ගුණයන් පහත පියවර අනුව විස්තර කරන්න.

- සුපටිපන්න හා උජුපටිපන්න ගුණ පැහැදිලි කරදෙන්න.
- ඤායපටිපන්න හා සාමීචිපටිපන්න ගුණ පැහැදිලි කරදෙන්න.
- ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය හා දක්ඛිණෙය්‍ය ගුණ පැහැදිලි කරදෙන්න.
- අංජලිකරණීය හා අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත ගුණ පැහැදිලි කරදෙන්න.
- සඟ ගුණ පිළිබඳ පැහැදිලි දැනුමක් ලබාදීම හා ඒවා සිය ජීවිතවලට බද්ධකර ගැනීමට පෙළඹවීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ත්‍රිපිටකයේ සහ අටුවා ග්‍රන්ථවලත් සඟගුණ සඳහන්ව ඇති බව පැහැදිලි කරන්න.
- සඟගුණ පදනම් කරගෙන පුරාතන සම්භාව්‍ය ධර්ම ග්‍රන්ථ පවා රචනා වී ඇති බවත් පැහැදිලි කර දෙන්න.
- සඟගුණ භාවනාවක් ලෙස ප්‍රගුණ කළ යුතු බවත් පැහැදිලි කර දෙන්න.
- එමගින් ශ්‍රද්ධාව වැඩෙන බවත් පැහැදිලි කර දෙන්න.
- සඟ ගුණ සිය ජීවිතවලට එක්කර ගැනීමට උත්සාහ ගත යුතු බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- විසුද්ධි - පිරිසිදු බව
- අංජලිකරණීය - ඇඳිලිබැඳ පිදිය යුතු
- සද්ධිවිහාරික - විහාරස්ථානයේ එකට වාසය කරන, සමාන ගුණ, සමාන සීලය හා සමාන ඇවැතුම් පැවැතුම් ඇති තැනැත්තා
- උපජ්ඣාය - පැවිදිකළ ගුරුවරයා
- ලොකස්ස - ලෝවැසි ජනයාට

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- පෙළ පොතේ තුන්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- සඟගුණයට අදාළ පාලි පාඨය ශබ්ද නගා සජ්ඣායනා කිරීම.
- එක් එක් සඟගුණය මතකයෙන් ඉදිරිපත් කිරීම.
- ඒ ඒ ගුණයන්ට අදාළ තේරුම් පිටපත් කිරීම.
- සූවිසි ගුණයන් වගු ගත කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

**ඇමුණුම් 01. ප්‍රවේශය සඳහා**

- සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ, උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ, ඤායපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ, සාමීචිපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා ඒස භගවතෝ සාවක සංඝෝ, ආහුනෙය්‍යෝ, පාහුනෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති

- රේරුකානේ චන්දවිමල මහනාහිමි - සූවිසි මහාගුණ

# 4 පාඩම
# බුද්ධකාලීන මහා ශ්‍රාවක ශ්‍රාවිකා චරිතාදර්ශ

**නිපුණතාව:-2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ජාතකකතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කරගනියි.

**නිපුණතා මට්ටම:-2.1**

- ශ්‍රාවකශ්‍රාවිකා චරිතවලින් පැහැදිලි වන ගුණාංග ආදර්ශ කොටගෙන තම ජීවිතය සාර්ථක කරගනියි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. ශ්‍රාවකශ්‍රාවිකා ජීවන තොරතුරු පවසයි.
2. ශ්‍රාවකශ්‍රාවිකාවන් සතු සුවිශේෂී ගුණාංග පිළිගනිමින් කටයුතු කරයි.
3. ශ්‍රාවකශ්‍රාවිකාවන්ගේ ශ්‍රේෂ්ඨ ගුණ කදම්බය පිළිබඳ සාකච්ඡා කරයි.
4. ආදර්ශවත් චරිත පිළිබඳ කරුණු සොයා බලයි.
5. පරමාදර්ශී ජීවිතයක් ගතකරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි හතරවන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ''ඒතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං ධුතවාදීනං යදිදං මහාකස්සපො'' යන පාඨය ලියූ පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- මෙහි අදහස සාකච්ඡාවට බඳුන් කරන්න.
- මහාකාශ්‍යප තෙරුන් වහන්සේ පිළිබඳ අදහස ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- මහාකාශ්‍යප තෙරුන් වහන්සේ පිළිබඳ කරුණු සෙවීමට යොමුකරන්න.
- එම කරුණු සටහන් කිරීමට දැනුම් දෙන්න.
- උන්වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ සොයන ලෙස දන්වන්න.
- උන්වහන්සේගෙන් පළමු සංගායනාවට ලැබුණු නායකත්වය පිළිබඳ සාකච්ඡා කරන්න.

- මේ ආකාරයට පටාචාරා තෙරණිය පිළිබඳවත් කරුණු සාකච්ඡා කරන්න.
- බුදුරදුන් සුදුසුකම් මත ශ්‍රාවකයන්ට අගතනතුරු ප්‍රදානය කළ බව පෙන්වා දෙන්න.
- ශ්‍රාවිකාවන්ටත් එලෙස ම තනතුරු ප්‍රදානය කළ බවත් පැහැදිලි කරන්න.
- මහාකාශ්‍යප මහරහතන්වහන්සේට ධුතාංගධාරීන් අතර අග තනතුර ප්‍රදානය කළ බව විස්තර කරන්න.
- පටාචාරා තෙරණියට විනයධර භික්ෂුණීන් අතර අගතනතුර ප්‍රදානය කළ බව පැහැදිලි කරන්න.
- එම චරිත අපට ආදර්ශයට ගත හැකි බවත් පෙන්වා දෙන්න.
- ලක්ෂ ගණනක් රහතන් වහන්සේලා අතර අසූ මහාශ්‍රාවකයන් හා ශ්‍රාවිකාවන් සුවිශේෂී වූ බව විස්තර කරන්න.
- මෙම තනතුරු අහඹු ලෙස නොලැබෙන බවත් ඒ සඳහා උන්වහන්සේලා සසර පෙරුම් පුරා පැමිණි බවත් පැහැදිලි කරන්න.
- සුදුස්සාට සුදුසු තැන ලබාදීම හා මුහුණ බලා තනතුරු ලබා නොදිය යුතු බවත් පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- වැඳහෙව - වැඳවැටී
- ඕවාද පටිග්ගහණ - අවවාද පිළිගැනීම
- කඩමාල්ල - ඉරුණු හෝ දිරාගිය වස්ත්‍රය
- පටාචාරා - වස්ත්‍රනැතිව සිහිවිකලෙන් ඇවිදින
- උද්දිස්ස - උදෙසා පැවිදි වූ
- සිව්පිළිසිඹියාපත් - අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන යන සතර

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම් අංක 1

- ''ඒතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං ධුතවාදීනං යදිදං මහාකස්සපො'' යන පාඨය ලියන ලද පුවරුව.
- පෙළපොතේ හතරවන පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- චරිත කතා දෙක මතකයෙන් කීම.
- එම චරිතාදර්ශ පිළිබඳ ප්‍රකාශ කිරීම.
- අසූ මහාශ්‍රාවකයන් පිළිබඳ තොරතුරු එක් රැස්කිරීම.
- එම චරිතකතා ඇසුරු කරමින් ධර්ම දේශනාවක් පැවැත්වීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- ගයාන් චානුක විදානපතිරණ - පටාචාරා තෙරණිය
- ගයාන් චානුක විදානපතිරණ - මහාකාශ්‍යප මහරහතන් වහන්සේ

# 5 පාඩම
## සසුන එකලු කළ නූතන යතිවරු

**නිපුණතාව:-2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ජාතකකතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කරගනියි.

**නිපුණතා මට්ටම:-2.1**

- ශ්‍රාවකශ්‍රාවිකා චරිතවලින් පැහැදිලි වන ගුණාංග ආදර්ශකොට ගෙන තම ජීවිතය සාර්ථක කරගනියි.

**කාලපරිච්ඡේද:-** 08 යි

**ඉගෙනුම්පල:-**

1. සසුන එකලු කළ නූතන යතිවරුන් පිළිබඳ ජීවන තොරතුරු පවසයි.
2. සසුන එකලු කළ නූතන යතිවරුන් සතු සුවිශේෂී හැකියාවන් පිළිගනිමින් කටයුතු කරයි.
3. සසුන එකලු කළ නූතන යතිවරුන් සිව්නමක් පිළිබඳ තොරතුරු ලැයිස්තු ගතකරයි.
4. වෙනත් ආදර්ශවත් යතිවරුන් පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.
5. චරිතාදර්ශයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි පස් වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ධම්මාලෝක, හේන්පිටගෙදර ඥානසීහ හා රේරුකානේ චන්දවිමල යන නාහිමිවරුන්ගේ සිතුවම් හෝ ඡායාරූප ඇතුළත් පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- මෙම හිමිවරුන් පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සසුන එකලුකළ නූතන යතිවරුන් පිළිබඳ වදන ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- හික්කඩුවේ සුමංගල නාහිමි පිළිබඳ හඳුන්වා දෙන්න.
- හික්කඩුවේ සුමංගල නාහිමි චරිතයෙන් ගතහැකි ආදර්ශ සාකච්ඡා කරන්න.
- රත්මලානේ ධම්මාලෝක නාහිමි පිළිබඳ හඳුන්වා දෙන්න.
- රත්මලානේ ධම්මාලෝක නාහිමි චරිතයෙන් ගතහැකි ආදර්ශ සාකච්ඡා කරන්න.
- හේන්පිටගෙදර ඥානසීහ නාහිමි පිළිබඳ හඳුන්වා දෙන්න.
- හේන්පිටගෙදර ඥානසීහ නාහිමි චරිතයෙන් ගතහැකි ආදර්ශ සාකච්ඡා කරන්න.
- රේරුකානේ චන්දවිමල නාහිමි පිළිබඳ හඳුන්වා දෙන්න.

- රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි චරිතයෙන් ගතහැකි ආදර්ශ යන කරුණු පිළිබඳ විස්තර කරන්න.
- විදේශීය ආක්‍රමණ නිසා බුදුදහමට අභියෝග එල්ල වී තිබූ බව පැහැදිලි කරන්න.
- බෞද්ධ අධ්‍යාපනය අභිබවා මිෂනාරී අධ්‍යාපනය බලවත්ව පැවැති බව පැහැදිලි කරන්න.
- මේවාට පිළියම් ලෙස බෞද්ධ සරසවි ආරම්භ කිරීමට පුරෝගාමීව කටයුතු කළ බවත් පැහැදිලි කරන්න.
- ඉහත යතිවරයන් වහන්සේලා ඉතා මැනවින් අධ්‍යාපනය හදාරා ශ්‍රේෂ්ඨ යතිවරුන් බවට පත් වූ බව සාකච්ඡා කරන්න.
- එකී යතිවරුන්ගේ ඇසුර ලබමින් දේශීය හා විදේශීය විද්වතුන් රැසක් බිහි වූ බව පැහැදිලි කර දෙන්න.
- ස්වකීය දැනුම අනාගත පරපුරට දායාද කිරීම සඳහා මෙම යතිවරයන් වහන්සේලා විවිධ මාතෘකා ඔස්සේ බොහෝ ග්‍රන්‍ථ රචනා කළ බවත් පැහැදිලි කරන්න.
- උගත්කම මෙන් ම අනතිමානී ගුණයන්ගෙන් උපලක්ෂිත වූ ජීවන චරිතයක් එකී යතිවරුන් තුළින් මනාව ප්‍රකට වූ බව පෙන්වා දෙන්න.
- මෙම යතිවරයන් වහන්සේලාගෙන් චරිතාදර්ශ ලබාගෙන තම ජීවිතය සාර්ථක කරගැනීම සඳහා බොහෝ ආදර්ශ ලබාගත හැකිබව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පාරුපනවාද - සිවුරු පෙරවීම පිළිබඳ ඇති වූ විවාදය
- ධර්මශාස්ත්‍රෝන්නතිකාමී - ධර්ම ශාස්ත්‍රයේ උන්නතිය හෙවත් පැවැත්ම කැමති
- වෘද්ධ - මහලු
- බහුශ්‍රැත - බොහෝ ඇසූ පිරූ තැන් ඇති
- පන්හිඳ - ලිවීමට ගන්නා උපකරණය (පෑන වැනි)

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම් අංක 1

- හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ධම්මාලෝක, හේන්පිටගෙදර ඥානසීහ හා රේරුකානේ චන්ද්‍රවිමල යන නාහිමිවරුන්ගේ සිතුවම් හෝ ඡායාරූප
- පෙළ පොතේ පස්වන පාඩම.

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- යතිවරයන් වහන්සේලා පිළිබඳ තොරතුරු මතකයෙන් කීම.
- එම චරිතාදර්ශ පිළිබඳ ප්‍රකාශ කිරීම.
- අනෙකුත් ශ්‍රේෂ්ඨ යතිවරුන් පිළිබඳ තොරතරු එක් රැස්කිරීම.
- එම චරිත කතාවක් ඇසුරු කරමින් බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- යගිරල පඤ්ඤානන්ද නාහිමි - ශ්‍රී සුමංගල චරිතය
- හේන්පිටගෙදර ඥානසීහ නාහිමි - හේන්පිටගෙදර සිට වැලිකඩ හරහා
- කිරිඹරුවේ ධම්මානන්ද හිමි - මෙකල නිවුණු ඇත්තෝ
- රංජිත් අමරකීර්ති පළිහපිටිය - පූජිත ජීවිත

# 6 පාඩම
# පරමාදර්ශී උපාසක උපාසිකා චරිත හඳුනා ගනිමු.

**නිපුණතාව:-2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ජාතකකතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගී කරගනියි.

**නිපුණතා මට්ටම:-2.2**

- තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම්පල:-**

1. පරමාදර්ශී උපාසකඋපාසිකා චරිතවල ජීවන තොරතුරු පවසයි.
2. පරමාදර්ශී උපාසකඋපාසිකා චරිත ජීවිතාදර්ශයට ගැනීමෙන් තම ජීවිතය ද මනා සේ සාර්ථකත්වය කරා ගෙන යා හැකිබව පිළිගනිමින් කටයුතු කරයි.
3. උපාසකඋපාසිකා චරිත කිහිපයක් නම්කොට, චරිත සංවර්ධනයට ලබාගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරයි.
4. අර්ථවත් ජීවිතයක් ගත කරයි.
5. අනගාරික ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- අනේපිඬු සිටුතුමා, විශාඛා උපාසිකාව සහ අනගාරික ධර්මපාල තුමා යන පරමාදර්ශී උපාසක, උපාසිකා චරිත පිළිබඳ දැක්වෙන හය වන පාඩම කියවා පැමිණෙන මෙන් පෙර දිනයේ ශිෂ්‍යයන්ට දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම් අංක 01 හි සඳහන් ධනංජය සිටුතුමා විශාඛාවට දුන් අවවාද ලියන ලද පුවරුව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම අවවාද තුළින් කියවෙන්නේ කුමක් ගැන ද? යන්න සාකච්ඡා කරමින් වත්මන් සමාජයට එය කෙතරම් අගනේ ද යන්න පිළිබඳ අදහස ඉස්මතුකර ගැනීමට සිසුන්ව මෙහෙයවන්න.

**06. පාඩම් සංවර්ධනය:-**

- උපාසක උපාසිකාවන් සිව්වණක් පිරිසට අයත් කොටසක් බව පෙන්වා දෙන්න.
- අද මෙන් ම එදත් විහාරස්ථාන දියුණුවට ආරාම ආදිය පූජා කළ ආකාරය පෙන්වා දෙන්න.

- කල්‍යාණමිත්‍ර සම්පත්තිය පුද්ගලයෙකු පමණක් නොව තමන් ඇසුරු කරන අයගේ ද ජීවිත ආලෝකවත් කරවීමට හේතුවන බව පැහැදිලි කරන්න.
- සුදත්ත සිටුතුමා බුදුසසුනේ අග්‍රදායකයා බව පැහැදිලි කරන්න.
- ජේතවනාරාම පූජාව එතුමා සිදු කළ සුවිශේෂී පින්කමක් බව සාකච්ඡා කරන්න.
- එම චරිතයෙන් ගතහැකි ආදර්ශ විමසන්න.
- විශාඛා උපාසිකාව බුදුසසුනේ අග්‍රදායිකාව බව පැහැදිලි කරන්න.
- ධනංජය සිටුතුමා විශාඛාවට දුන් අවවාද දහය විස්තර කරන්න.
- සාර්ථක පවුල් ජීවිතයකට බුදුදහම ඉවහල් වන බවත් පෙන්වා දෙන්න.
- ඒවායෙහි කාලීන අගය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අනගාරික ධර්මපාල චරිතය පිළිබඳ විස්තර කරන්න.
- බුද්ධගයාව බේරාගැනීම සඳහා එතුමා කළ මෙහෙය පිළිබඳ විස්තර කරන්න.
- ජාතික වීරවරයන්ගේ චරිතවලින් ගත හැකි ආදර්ශ පිළිබඳ දැනුම්වත් කරන්න. ජාතික වීරයින් කලින් කලට රටේ වාසනාවට බිහිවන බව පැහැදිලි කරන්න.
- ඔවුන් ස්වකීය සුඛ විහරණය පසෙක තබා පොදු යහපත උදෙසා අපමණ කැපකිරීම් සිදුකරන බවත් පැහැදිලි කර දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ප්‍රදක්ෂිණා කිරීම - තමාගේ දකුණු අත සෑය හෝ බෝධීන් වහන්සේ පැත්තට සිටින සේ වැඳගෙන වටේ ගමන් කිරීම.
- වැසි සළුව - වස්වසන භික්ෂූන් වහන්සේට වස් ආරාධනා කිරීමේ දී පූජා කරන වස්ත්‍රය. (නානකඩය)
- මිෂනාරී අධ්‍යාපනය - බෞද්ධ අධ්‍යාපනයට විරුද්ධව (පන්සල් අධ්‍යාපනය) එදා ආරම්භ කළ ක්‍රිස්තියානි අධ්‍යාපනය
- ගෙරි මස් - ගවමස්
- මහන්තා - බුද්ධගයාව අත්පත් පත් කරගෙන සිටි හින්දු පූජකතුමා, (අනගාරික ධර්මපාලතුමා බුද්ධගයාව බේරාගැනීමට ප්‍රථම එම ස්ථාන පාලනය කළේ මහන්තා විසිනි)

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- ධනංජය සිටුතුමා විශාඛාවට දුන් අවවාද ලියන ලද පුවරුව.
- පෙළ පොතේ හයවන පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- අග්‍රදායකදායිකා දෙපල පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- අනගාරික ධර්මපාල තුමා පිළිබඳ කතාවක් පවත්වයි.
- ධනංජය සිටුතුමා දුන් අවවාද දහය මතකයෙන් ඉදිරිපත් කරයි.
- එම අවවාද දහය හා ඊට අදාළ තේරුම් පිටපත් කරයි.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- නිවන්දම ධර්මකීර්ති හිමි - බුද්ධකාලීන උපාසක උපාසිකාවෝ
- කේ. බී. සුගතදාස - අනගාරික ධර්මපාල අපදානය.

# 7 පාඩම
## සම්බුදු සසුනෙහි ආයුෂය විනය යි.

**නිපුණතාව:-3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර භික්ෂු ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:-3.1**

- විනය පිටකයේ ස්වභාවය හැඳින විනයානුකූල ජීවිතයක් ගත කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම්පල:-**

1. විනය පිටකයේ වැදගත්කම පවසයි.
2. සාර්ථක භික්ෂු ජීවිතයකට විනය වැදගත්වන බව පිළිගනිමින් කටයුතු කරයි.
3. විනය ශික්ෂා බෙදී ගිය ආකාරය මතකයෙන් ලියයි.
4. විනයානුකූල ජීවිතයක් ගත කරයි.
5. දුසිල්වත් බවින් තොරව සිල්වත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- ත්‍රිපිටක ධර්මය පොතෙහි දැක්වෙන හත් වන පාඩම කියවා පැමිණෙන මෙන් පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- විනය පිටකයේ බෙදීම් ඇතුළත් පුවරුව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එම පොත්වල ඇතුළත් කරුණු පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.
- විනය යන පදය අර්ථවත්ව ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- විනය පිටකය පිළිබඳ හඳුන්වා දෙන්න.
- විනය යනු ත්‍රිපිටකයට අයත් කොටසක් බව පෙන්වා දෙන්න.
- එහි ප්‍රධාන ග්‍රන්ථ පහක් ඇති බවත් ඒවා ''පාළි'' වශයෙන් වර්ග කොට ඇති බවත් සාකච්ඡා කරන්න.
- පාරාජික පාළි හා ඊට අදාළ කොටස් පිළිබඳව විස්තර කරන්න.
- පාචිත්තිය පාළි හා ඊට අදාළ කොටස් පිළිබඳව විස්තර කරන්න.
- මහාවග්ග පාළි හා ඊට අදාළ කොටස් පිළිබඳව විස්තර කරන්න.
- චුල්ලවග්ග පාළි හා ඊට අදාළ කොටස් පිළිබඳව විස්තර කරන්න.

- පරිවාර පාළි හා ඊට අදාළ කොටස් පිළිබඳව විස්තර කරන්න.
- එම විනය කොටස් අප ජීවිතයට එක්කර ගතයුතු බව සාකච්ඡා කරන්න.
- විනයධර භික්ෂූන් අතර උපාලි මහරහතන් වහන්සේ අගතැන්පත් බව පැහැදිලි කරන්න.
- විනයධර භික්ෂුණීන් අතර පටාචාරා තෙරණිය අගතැන්පත් බව පැහැදිලි කරන්න.
- විනයගරුක තැනැත්තා සමාජයේ සැමතැන ම කැපී පෙනෙන බව පැහැදිලි කරන්න.
- විනය පිටකයට අදාළ ශික්ෂා ප්‍රමාණය විශාල බැවින් පළමු ධර්ම සංගායනාවේ දී ඒවා කොටස් කළ බව විස්තර කරන්න.
- එම කොටස් උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යැමට පැවරුණු බව පැහැදිලි කරන්න.
- විනය පිටකයේ අදාළ ශික්ෂා කිසිදු වෙනසකට පත් නොකොට පරපුරෙන් පරපුරට පවත්වාගෙන අවුත් ථේරවාදී භික්ෂු සමාජය තුළ අද දක්වා නොනැසී පවතින බව පැහැදිලි කරන්න.
- සාර්ථක භික්ෂු ජීවිතයකට එම කොටස්වල ඇති වැදගත්කම පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- විනය පිටකය - පළමු ධර්ම සංගායනාවේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළ විනය ශික්ෂාපද එක්කොට කරන ලද පිටකය.
- ආසවට්ඨානීය - බුදුසසුන පිරිහීමට බලපාන හේතු
- උභතොවිභංග - විභංග දෙක එනම්, භික්ඛු විභංග හා භික්ඛුණී විභංග

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- පාරාජික පාළි
- පාචිත්තිය පාළි
- මහාවග්ග පාළි
- චුල්ලවග්ග පාළි
- පරිවාර පාළි යන විනය පොත් පහේ නම් ලියන ලද පුවරුව.
- පෙළපොතේ හත්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය.

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- විනය පිටකයට අදාළ පොත් පහ මතකයෙන් කියයි.
- එම පාළි ග්‍රන්ථයන්හි අඩංගු දේ පිළිබඳ විස්තර කරයි.
- විනය පිටකය භික්ෂු ජීවිතයට කෙතරම් අගනේ ද යන්න පිළිබඳ කතාවක් පවත්වයි.
- ''විනයෝ නාම සාසනස්ස ආයු'' යන මාතෘකාව ඔස්සේ පුවත් පතකට ලිපියක් සකස් කරවන්න

## වැඩිදුර පරිශීලනයටඃ-

- රේරුකානේ චන්දවිමල මහනාහිමි - ශාසනාවතරණය

# 8 පාඩම
# සසුන් කෙත සරු කරන උපසම්පදාව

**නිපුණතාව:- 3.0**

- බෞද්ධ විනය හා ශික්‍ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර භික්‍ෂු ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:-3.1**

- උපසම්පදා සීලයෙහි වැදගත්කම හැඳින සාර්ථක භික්ෂු ජීවිතයක් ගත කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. උපසම්පදා විනය කර්ම ක්‍රම 08 ක් ඇති බව පැහැදිලි කරයි.
2. සංඝ සමාජයේ පූර්ණ සාමාජිකත්වය ලැබෙන්නේ උපසම්පදාවෙන් බව පිළිගනිමින් කටයුතු කරයි.
3. උපසම්පදා භික්‍ෂුවක් සතුව පැවැතිය යුතු ගුණාංග ප්‍රකාශ කරයි.
4. උපසම්පදාව ගරු කරමින් සඟ මහලු පිළිවෙතින් කටයුතු කරයි.
5. සතර පාරාජිකාවන්ට පත් නො වී උපසම්පදා සීලය රැකීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- අට වන පාඩම කියවා උපසම්පදා කිරීමට නුසුදුසු පුද්ගලයෝ කවරහු දැයි, බලාගෙන එන ලෙස පෙර දිනයේ සිසුන්ව දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- උපසම්පදා වීමට නුසුදුසු පුද්ගලයන් කිහිපදෙනෙකු නම්කරන ලද පුවරුව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- උපසම්පදා වීමට නුසුදුසු පුද්ගලයන් කවුරුන්ද යන්න පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ඒ තුළින් උපසම්පදා සීලය යන්න ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- පැවිදි උපෝසථය විස්තර කරන්න.
- උපසම්පදා විනය කර්මය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- උපසම්පදාවේ ආරම්භය පැහැදිලි කරන්න.
- අතීතයේ සිට වර්තමානය දක්වා පැවැති උපසම්පදා ක්‍රම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ඒවායෙහි එකිනෙක අතර පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න.
- උපසම්පදා විනය කර්මයක පවත්නා චාරිත්‍ර විස්තර කරන්න.
- අකරණීය ධර්ම හෙවත් පාරාජිකා විස්තර කරන්න.
- නිශ්‍රය ධර්ම පැහැදිලි කරන්න.
- උපසපන් භික්‍ෂුව ආරක්‍ෂා කළයුතු ශික්‍ෂාපද සාකච්ඡා කරන්න.

- උපසම්පදාවෙන් වැඩිහිටි භික්ෂුවට රහතන් වහන්සේ වුව ද ගරු කළයුතු බවත්, වැඳිය යුතු බවත් පැහැදිලි කරන්න.
- පාරාජිකාපත්තියකට පත්වුවහොත් කරටිය සුන්ව ගිය තාල වර්ගයේ රුකක් නැවත ලියලන්නේ නැත්තාක් සේ භික්ෂුභාවය ද නැති වී යන බව පැහැදිලි කරන්න.
- එසේ උපසම්පදා සීලය විනාශ වුවහොත් නැවත උපසම්පදා විය නොහැකි බව පැහැදිලි කරන්න.
- පාරාජිකාවීම අපායගාමී වීමට හේතුවක් වන බවත් පෙන්වා දෙන්න.
- උපසම්පදා ක්‍රම අට අතුරෙන් ඤත්ති චතුත්ථකම්ම උපසම්පදාව පමණක් වර්තමානයේ ඇති බව අවධාරණය කරන්න.
- මෙම ක්‍රමයෙන් මුලින් ම උපසම්පදාව ලැබුවේ රාධ නම් භික්ෂුව බව පැහැදිලි කරන්න.
- උපසම්පන්න භික්ෂුවක රැකියයුතු ශික්ෂාපද ප්‍රමාණය 227 ක් බව පැහැදිලි කරන්න.
- භික්ෂුණියක රැකිය යුතු ශික්ෂාපද 311 ක් බවත් පෙන්වා දෙන්න.
- අන්තරායික ධර්මවලින් යුක්ත පුද්ගලයින් උපසම්පදා නොකළ යුතු බව අවධාරණය කරන්න.
- එසේ උපසම්පදා කිරීමෙන් ආපත්ති සිදුවන අතර මහජන ප්‍රසාදය ද සිඳී යන බවත් පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප:-**

- ඤත්ති - දැනුම් දීම
- ප්‍රත්‍යන්ත - පිටිසර ප්‍රදේශ
- උදකුක්ඛේපසීමා - ජලයෙන් වට වූ පොහොය සීමාව
- පාරාජිකා - පැරදීම යන අර්ථය යි
- ශික්ෂණ - හික්මීම
- පණ්ඩක - නපුංසක
- නාගො - උපසම්පදා අපේක්ෂකයා
- කෝටියක් සංවර සීලය යනු උපසම්පදා සීලය යි
- කෝටියක් යන්නෙන් කෙළවර වූ යන්න අර්ථ ගැන්වෙයි
- සීලයන් අතර උසස් ම සීලය උපසම්පදා සීලය යි

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- උපසම්පදා කිරීමට නුසුදුසු පුද්ගලයන් කිහිප දෙනෙකුගේ නම් ලියූ පුවරුව.
- පෙළ පොතේ අටවන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-**

- උපසම්පදා සීලය වැදගත් වන්නේ මන්දැයි පහදන්න.
- උපසම්පදාවේ ආරම්භය හා වර්තමාන උපසම්පදා ක්‍රමය කෙටියෙන් පහදන්න.
- අන්තරායික ධර්මවලින් යුත් පුද්ගලයින් උපසපන් නොකිරීමට හේතු දක්වන්න.
- උපසම්පන්න භික්ෂුවක රැකිය යුතු ශික්ෂාපද වර්ග නම් කරන්න.

**වැඩිදුර පරිශීලනයට:-**

- රේරුකානේ චන්දවිමල මහනාහිමි - උපසම්පදා සීලය.

# 9 පාඩම
## සඟ සසුනේ පාලනය - පැවිදි උපෝසථය

**නිපුණතාව:-3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර භික්ෂු ජීවිතය හැඩ ගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:-3.2**

- උපසම්පදා ශීලයේ වැදගත්කම හැඳින සාර්ථක භික්ෂු ජීවිතයක් ගත කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. සංඝ උපෝසථ විනය කර්මය විස්තර කරයි.
2. උපෝසථ විනය කර්ම තුළින් අන්‍යෝන්‍ය ගෞරවය, සුහදතාව, සමගිය හා පාරිශුද්ධිය ගොඩනැගිය හැකිබව පිළිගනිමින් කතා කරයි.
3. ප්‍රාතිමෝක්ෂ දේශනාව කට පාඩමින් කියයි.
4. පවට බියෙන් භික්ෂුත්වයට නොගැලපෙන ක්‍රියාවෙන් ඈත්වෙයි.
5. භික්ෂු ජීවිතයේ සැබෑ අරුත වටහාගෙන අවබෝධයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,
- පෙළ පොතෙහි නව වන පාඩම කියවාගෙන එන ලෙස පන්තියට දැනුම් දෙන්න.

II ප්‍රවේශය
- පුබ්බකරණ සහ පුබ්බකිච්ච ඇතුළත් ගාථා යුගලය ලියන ලද පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- පුබ්බකරණ සහ පුබ්බකිච්ච පිළිබඳව ගාථා පළමුව තමා විසින් පසුව සජ්ඣායනා කර සිසුන් සමඟ ද සජ්ඣායනය කරන්න.
- ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවමින් පොහොය කර්ම යන වචනය ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**
- බිම්බිසාර රජුගේ ඇරයුමෙන් පොහොය කිරීම ආරම්භ වූ බව පැහැදිලි කරන්න.
- පුබ්බකරණ විස්තර කරන්න.
- පුබ්බකිච්ච විස්තර කරන්න.
- චාතුද්දසී උපොසථය, පණ්ණරසී උපෝසථය, සාමග්ගී උපෝසථය යනුවෙන් උපෝසථ වර්ග තුනක් ඇතිබව පැහැදිලි කරන්න.
- ඊට අමතරව ඇති සංඝ උපෝසථ, ගණ උපෝසථ, පුග්ගල උපෝසථ වශයෙන් තවත් කොටස් තුනක් ඇති බව පැහැදිලි කරන්න.
- තවත් සුත්තුත්දේස, පාරිසුද්ධි උපෝසථය, අධිට්ඨාන උපෝසථය පැහැදිලි කරන්න.

- සෑම අඩමසකට ම වරක් පොහොයකර්ම කිරීම බුද්ධ නීතියක් බව පැහැදිලි කරන්න.
- සංඝ උපෝසථය සිදුකරන ආකාරය විස්තර කර දෙන්න.
- විනය කර්ම කිරීමෙන් ශාසනය දීර්ඝ කාලයක් පවතින බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- මමච්චයෙන - මාගේ ඇවෑමෙන්
- පුබ්බකරණ - පොහොය කිරීමට පෙර කළයුතු කාර්යයන්.
- පුබ්බකිච්ච - පොහොය ගෙට රැස් වූ භික්ෂූන් වහන්සේලා පළමුව කළයුතු කාර්යයන්.
- පණ්ණරසී - පසළොස්වක පොහොය දවස
- දෙසකථෙර - පොහොය සීමාවේ දී පාමොක් දෙසන භික්ෂුව.
- පුච්ඡකථෙර - පොහොය සීමාවේ දී පාමොක් විමසන භික්ෂුව.
- උතුක්ඛානං - ඍතුව විමසීම, හේමන්ත, ගිම්හ, වස්සාන යන කාලයන් අතරින් එකක් කීම.
- භික්ඛු ගණනාව - පොහොය සීමාවට රැස් වූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය.
- ඕවාදො - භික්ෂුණීන් වහන්සේලාට අවවාද කිරීමයි. (අද මෙය සිදුවන්නේ නැත.)

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- සම්මජ්ජනී පදීපො ච - උදකං ආසනේන ච
- උපොසථස්ස ඒතානි - පුබ්බකරණන්ති වුච්චති
- ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං - භික්ඛු ගණනා ච ඔවාදො
  උපොසථස්ස එතානි - පුබ්බ කිච්චන්ති වුච්චති
  යන ගාථා ලියන ලද පුවරුව.
- පෙළ පොතේ නව වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- ප්‍රාතිමෝක්ෂ දේශනාව සිදුකිරීම.
- පුබ්බකරණ හා පුබ්බකිච්ච මතකයෙන් කීම.
- උපෝසථ කර්මයක් නිවරදිව සිදුකරන ආකාරය විස්තර කිරීම.
- භික්ෂු සමාජයේ පැවැත්මට විනය කර්මවල වැදගත්කම විස්තර කිරීම.

## වැඩිදුර පරිශීලනයටඃ-

- රේරුකානේ චන්දවිමල මහනාහිමි - උපසම්පදා සීලය

# 10 පාඩම
## අමතක වන්නට නොදිය යුතු කරුණු
## (පඨම සාරාණීය සූත්‍රය)

**නිපුණතාව:- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සළසා ගනී.

**නිපුණතා මට්ටම:- 4.1**

- නිකායාගත සූත්‍ර දේශනාවල ඇතුළත් දහම් කරුණු ඉගෙන ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද :-** 08 යි

**ඉගෙනුම්පල:-**

1. අංගුත්තර නිකායට අයත් සූත්‍ර කිහිපයක් විස්තර කරයි.
2. සූත්‍ර දේශනා මඟින් දහම් කරුණු විස්තර කෙරෙන බව පිළිගනිමින් කටයුතු කරයි.
3. පඨම සාරාණීය සූත්‍රයෙහි ඇතුළත් කරුණු 6 වෙන් වෙන් ව වගුගත කරයි.
4. සූත්‍රානුගත දේශනාවට අනුව ක්‍රියා කරයි.
5. ආර්ය ශීලයෙන් යුක්තව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළපොතෙහි දහ වන පාඩම කියවාගෙන එන ලෙස පන්තියට දැනුම් දෙන්න.

II ප්‍රවේශය

- පඨමසාරාණීය සූත්‍ර පෙළෙහි ''ඉධ භික්ඛවේ භික්ඛුනෝ මෙත්තං කායකම්මං............'' යනාදි පාඨය ලියන ලද පුවරුව ඉදිරිපත් කරන්න.
- එය සජ්ඣායනය කරමින් සිසුන් සමග ද සජ්ඣායනය කරන්න.
- එම සූත්‍රයෙහි සිහි කළයුතු කරුණු හයක් ඇතිබව ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රී සහගත කාය කර්මයෙන් යුක්ත වියයුතු බව පැහැදිලි කරන්න.
- මෛත්‍රී සහගත වාක් කර්මයෙන් යුක්ත වියයුතු බව පැහැදිලි කරන්න.
- මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් යුක්ත වියයුතු බව පැහැදිලි කරන්න.
- සිව්පසය සම්බන්ධයෙන් සබ්‍රහ්මචාරීන් සමග සාධාරණ භෝගී වියයුතු බව පැහැදිලි කරන්න.
- සබ්‍රහ්මචාරීන් හා සමාන වූ ආර්ය ශීලයෙන් යුක්ත වියයුතු බව විස්තර කරන්න.

- සමාන සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත වියයුතු බවත් විස්තර කර දෙන්න.
- දුතියසාරාණීය සූත්‍රයේ අඩංගු කරුණු සය ද පැහැදිලි කර දෙන්න.
- අංගුත්තර නිකායේ දුතිය සාරාණීය සූත්‍රය ද සමගිය පිළිබඳව දැක්වීමේ දී වැදගත් බව පැහැදිලි කරන්න.
- භික්ෂූන් වහන්සේලාගේ සමගි සම්පන්න බව සසුනේ ඉදිරි පැවැත්මට හේතුවන බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- සාරාණීය - සිහිකළයුතු
- ඛීරෝදකීභූතා - කිරිත් දියත් මුසු වූවා සේ
- කායකම්ම - කයින් සිදු කරන දේ
- වචීකම්ම - වචනයෙන් සිදු කරන දේ
- මනෝකම්ම - මනසින් සිදු කරන දේ
- සබ්‍රහ්මචාරීන් - සමාන සීලයෙන්, ගුණයෙන් යුතු එකට වාසය කරන පිරිස.
- සාධාරණභොගී - කිසියම් දෙයක් සද්ධිවිහාරිකයන් සමග සමානව පරිභෝග කිරීම.

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- පඨමසාරාණීය සූත්‍ර පෙළෙහි ''ඉධ භික්ඛවේ භික්ඛුනෝ මෙත්තං කායකම්මං...........'' යනාදී පාඨය ලියන ලද පුවරුව.
- පෙළ පොතේ දහවන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- සාරාණීය සූත්‍රදේශනාවේ අර්ථය මතකයෙන් කීම.
- එහි ඇතුළත් කරුණු සය විස්තර කිරීම. (සාරාණීය කරුණු)
- පිරිසක් සමග සාමූහිකව ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කිරීම.
- සීලය යන මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් සකස් කිරීම.

## වැඩිදුර පරිශීලනයටඃ-

- අංගුත්තර නිකාය - පඨම සාරාණීය සූත්‍රය.

# 11 පාඩම
## තමන් හැදී අනුන් හදන භික්ෂුව
## (ධම්මඤ්ඤූ සූත්‍රය)

**නිපුණතාව:- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍රධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනී.

**නිපුණතා මට්ටම:-4.1**

- නිකායාගත සූත්‍ර දේශනාවල ඇතුළත් දහම් කරුණු ඉගෙන ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. ධම්මඤ්ඤූ සූත්‍රයෙහි සරල අරුත් පවසයි.
2. ධම්මඤ්ඤූ සූත්‍රයෙහි අඩංගු කරුණු තුළින් අංග සම්පූර්ණ භික්ෂුවක් ඇතිවන බව පිළිගනිමින් කතා කරයි.
3. ධම්මඤ්ඤූ සූත්‍රයෙහි ඇතුළත් ධර්ම කරුණු 7 වෙන් වෙන් වශයෙන් විස්තර කරයි.
4. ධම්මඤ්ඤූ සූත්‍රයෙහි අඩංගු කරුණු අනුව ක්‍රියා කරයි.
5. මහජන ප්‍රසාදය ඇතිවන අයුරින් ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- එකොළොස් වන පාඩමේ ධම්මඤ්ඤූ සූත්‍රයේ සඳහන් සගගුණ මොනවාදැයි සටහන් කරගෙන එන ලෙස පෙර දිනයේ පන්තියේ සිසුන් දැනුම්වත් කරන්න.
- ගුරුවරයා ද එම කරුණු පුවරුවක ලියාගෙන එන්න.

II ප්‍රවේශය

- ගුරුවරයා ලියාගෙන ගිය සගගුණ ලියූ පුවරුව පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- එහි සඳහන් දේ හා සිසුන් ලියාගෙන ආ දේ සසඳමින් අද පාඩම ධම්මඤ්ඤූ සූත්‍රය යන්න ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ධම්මඤ්ඤූ ගුණය පැහැදිලි කරන්න.
- අත්ථඤ්ඤූ ගුණය පැහැදිලි කරන්න.
- අත්තඤ්ඤූ ගුණය පැහැදිලි කරන්න.
- මත්තඤ්ඤූ ගුණය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- කාලඤ්ඤූ ගුණය පැහැදිලි කරන්න.

- පරිසඤ්ඤූ ගුණය පැහැදිලි කරන්න.
- පුග්ගලපරොවරඤ්ඤූ ගුණය පැහැදිලි කරන්න.
- ධම්මඤ්ඤූ සූත්‍රයේ සියලු සඟගුණ සඳහන් නොවන බවත් ඊට අමතරව තවත් සඟ ගුණ ඇති බවත් පෙන්වා දෙන්න.
- සඟගුණයන් ගෙන් උපලක්ෂිත වූ භික්ෂුවගේ යහපත් ආකල්ප මොනවා දැයි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- භික්ෂූන් වහන්සේලාගේ සමගි සම්පන්න බව සසුනේ ඉදිරි පැවැත්මට හේතුවන බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ධම්මඤ්ඤූ - ධර්මය දත් තැනැත්තා
- අත්ථඤ්ඤූ - ධර්මයෙහි අර්ථ දන්නා තැනැත්තා.
- අත්තඤ්ඤූ - තමා පිළිබඳ දන්නා තැනැත්තා.
- මත්තඤ්ඤූ - සිව්පසයෙහි පමණ දන්නා තැනැත්තා.
- කාලඤ්ඤූ - තමාගේ කටයුතුවල වේලාව දන්නා තැනැත්තා.
- පරිසඤ්ඤූ - පිරිස් මැද හැසිරෙන අයුරු දන්නා තැනැත්තා.
- පුග්ගලපරොවරඤ්ඤූ - පුද්ගලයන්ගේ විවිධත්වය දන්නා තැනැත්තා.
- නවාංගසත්ථුසාසනය - මුල් කාලයේ දී බුද්ධවචනය හැඳින්වීමට යොදා ඇති තවත් නමකි. පසුකාලයේ දී ත්‍රිපිටකය ලෙසින් හැඳින්වූයේ ද මෙම නවාංගසත්ථුසාසනය යි.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- සඟගුණ ලියූ පුවරුව
- පෙළ පොතේ එකොළොස්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-**

- ධම්මඤ්ඤූ සූත්‍රයට අනුව සඟගුණ 7 මතකයෙන් කීම.
- එම ගුණාංග විස්තර කිරීම.
- නිවැරදිව පෙළ සජ්ඣායනා කිරීම.
- ධම්මඤ්ඤූ සූත්‍රයෙහි සඳහන් නොවන වෙනත් සඟ ගුණ කිහිපයක් ප්‍රකාශ කරයි.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- අංගුත්තර නිකාය, ධම්මඤ්ඤූ සූත්‍රය.
- අංගුත්තර නිකාය - ධම්මඤ්ඤූ සූත්‍රයට අදාළ අට්ඨකථාව.

# 12 පාඩම
## ජංගම නිධානය
## (නිධිකණ්ඩ සූත්‍රය)

**නිපුණතාව:- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍රධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනී.

**නිපුණතා මට්ටම:- 4.1**

- නිකායාගත සූත්‍ර දේශනාවල ඇතුළත් දහම් කරුණු ඉගෙන ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. නිධිකණ්ඩ සූත්‍රයෙහි සරල අරුත් පවසයි.
2. නිධිකණ්ඩ සූත්‍රයෙහි ඇතුළත් නිධාන සතර සාර්ථක ජීවිතයක් ගතකර ගැනීමට අවශ්‍ය බව පිළිගනිමින් කතා කරයි.
3. නිධිකණ්ඩ සූත්‍රයෙහි ඇතුළත් ධර්ම කරුණු 4 වෙන් වෙන් ව විස්තර කරයි.
4. ධන නිධානය අස්ථිර බවත් පුණ්‍ය නිධානය ස්ථිර බවත් පිළිගනිමින් ක්‍රියා කරයි.
5. අන් අයගේ පුණ්‍ය නිධානය වර්ධනය කරවීමට ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පාඩමෙහි එන ''නිධිං නිධෙති පුරිසො.............'' යන ගාථාව ඊළඟ දවසේ කටපාඩම් කරගෙන එන ලෙස පන්තියට දැනුම් දෙන්න.

II ප්‍රවේශය

- පාඩම්කරගෙන ආ ''නිධිං නිධෙති පුරිසො.............'' යන ගාථාව සිසුන් සමඟ සජ්ඣායනා කරමින් පාඩම ආරම්භ කරන්න.
- ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කරමින් නිධිකණ්ඩ සූත්‍රය යන්න ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ධර්මයට අනුව නිධාන හතරක් ඇතිබව පෙන්වා දෙන්න.
- ස්ථාවර නිධානය විස්තර කරන්න.
- ජංගම නිධානය විස්තර කරන්න.
- අංගසම නිධානය විස්තර කරන්න.
- අනුගාමික නිධානය විස්තර කරන්න.
- නිධානවලින් සම්පත්ති උදාවන ආකාරය හා අනතුරු වළක්වන ආකාරය සාකච්ඡාවට ලක් කරන්න.

- ස්ථාවර, ජංගම, අංගසම යන නිධාන මෙලොව දියුණුවටත්, අනුගාමික නිධානය පරලොවටත් වැදගත් වන බව අවධාරණය කරන්න.
- භික්ෂූන් වහන්සේලාගේ සමගි සම්පන්න බව සසුනේ ඉදිරි පැවැත්මට හේතුවන බව පෙන්වා දෙන්න.
- පාඩමෙහි සඳහන් ගාථා කිහිපයක් කටපාඩම් කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- සුවණ්ණතා - හමේ රන්වන් පැහැය
- සුස්සරතා - මිහිර හඬ
- සුසණ්ඨාන සුරූපතා - අඩුපාඩුනොමැතිව ඇති රූපසම්පන්න බව
- යොනිසෝ මනසිකාර - නිවැරදිව සිහිය පිහිටුවා ගැනීම
- ත්‍රිවිධ චෛත්‍යය - ශාරීරික, පාරිභෝගික, උද්දේසික චෛත්‍යය
- මිත්තසම්පදමාගම්ම - කල්‍යාණමිත්‍ර සම්පත්තිය ලබාගෙන
- උදකන්තිකෙ - දිය කෙළවර කොට ඇති
- චවති - චුත වේ, ඉවත් වේ
- අජෙය්‍යො - නොදිනිය හැකි
- ගිහියන්ගේ මෙලොව දියුණුව පිණිස බුදුරජාණන් වහන්සේ තවත් සූත්‍ර දේශනා කොට ඇතිබවත් පෙන්වා දෙන්න. (සිඟාලෝවාද, සංඛිත්තධන යනාදී සූත්‍ර)

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- පෙළ පොතේ දොළොස්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-**

- නිධිකණ්ඩ සූත්‍රයෙහි ඇතුළත් කරුණු සතර වෙන් වෙන් වශයෙන් විස්තර කරන්න.
- නිධිකණ්ඩ සූත්‍රයෙහි අභිමත ගාථාවක් තෝරාගෙන ධර්ම පත්‍රිකාවක් සකසන්න.
- කෙටි භුක්තානුමෝදනාවක් ඉදිරිපත් කරන්න.
- ධන නිධානය අස්ථිර බවත් පුණ්‍ය නිධානය ස්ථිර බවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- අංගුත්තර නිකාය - ධම්මඤ්ඤූ සූත්‍රය
- අංගුත්තර නිකාය ධම්මඤ්ඤූ සූත්‍ර අට්ඨකථාව

# 13 පාඩම
## ගිහියාගේ දියුණුව
## (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය)

**නිපුණතාව:- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍රධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනී.

**නිපුණතා මට්ටම:- 4.1**

- නිකායාගත සූත්‍ර දේශනාවල ඇතුළත් දහම් කරුණු ඉගෙන ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සරල අරුත් පවසයි.
2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි ඇතුළත් දහම් කරුණු පිළිපැදීම තුළින් මෙලොව පරලොව දියුණුව ළඟාකරගත හැකිබව පිළිගනිමින් කටයුතු කරයි.
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි ඇතුළත් දෙලොව දියුණුවට හේතුවන කරුණු වෙන් වෙන් වශයෙන් විස්තර කරයි.
4. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි ඇතුළත් කරුණු අනුව ක්‍රියා කරමින් මෙලොව ජීවිතය සාර්ථක කර ගනියි.
5. දෙලොව අභිවෘද්ධිය ළඟා කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙමින් ධර්ම දේශනා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- දහතුන් වන පාඩමෙහි සඳහන් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව මෙලොව දියුණුවට හේතුවන කරුණු සතර හා පරලොව දියුණුවට හේතුවන කරුණු සතර සටහන් කරගෙන එන ලෙස පන්තියට දැනුම් දෙන්න.

**II** ප්‍රවේශය

- සිසුන් ලියාගෙන ආ කරුණු අට විමසමින් කළුලෑල්ල මත ඒවා වෙන වෙන ම ලියන්න.
- මෙලොව දියුණුවට බුදුදහමින් කියාදෙන කරුණු බොහෝ ඇතිබව පෙන්වමින් ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යන්න ඉස්මතු කර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව මෙලොව දියුණුවට හේතුවන කරුණු සතරක් ඇතිබව පෙන්වා දෙන්න.
- උට්ඨාන සම්පදාව විස්තර කරන්න.

- ආරක්ඛ සම්පදාව විස්තර කරන්න.
- කල්‍යාණමිත්තාව විස්තර කරන්න.
- සමජීවිකතා විස්තර කරන්න.
- පරලොව දියුණුවට හේතුවන කරුණු සතරක් ඇතිබව සාකච්ඡා කරන්න.
- සද්ධා සම්පදාව විස්තර කරන්න.
- සීල සම්පදාව විස්තර කරන්න.
- චාග සම්පදාව විස්තර කරන්න.
- පඤ්ඤා සම්පදාව විස්තර කරන්න.
- ධර්ම දේශනාවක් පැවැත්වීම සඳහා මෙම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි ඇතුළත් කරුණු වැදගත් වන බව සාකච්ඡා කරන්න.
- මූලික වදන් හා සංකල්ප අභ්‍යාස පොතේ ලියා ගැනීමට කටයුතු කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- අජද්ධුමාරික - නොකා නොබී
- කසියා - කෘෂිකර්මය, ගොවිතැන
- රාජපොරිසෙන - රාජපුරුෂයා හෙවත්, රාජ්‍ය සේවකයා
- සල්ලපති - කතා කරනවා, සාකච්ඡා කරනවා
- සාකච්ඡං සමාපජ්ජති - සාකච්ඡාවට එළඹෙනවා
- ගොරක්ඛේන - ගව පාලනය
- තුලාධාරන්තේවාසි - තරාදිය අත දරාගත් කෙනාගේ ගෝලයා (වෙළඳ සහායක)
- බාහාබලපරිචිතා - දෑතේ වීර්යයෙන්
- දහරා වා වුද්ධසීලිනො - තරුණ වුවවත් වැඩිහිටි සිල් ඇති
- දාන සංවිභාගරතො - බෙදා හදාගෙන දන් දීමෙහි නිරතවන

## ගුණාත්මක යෙදවුම්ඃ-

- පෙළ පොතේ දහතුන්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-

- මෙලොව හා පරලොව දියුණුවට හේතුවන කරුණු මතකයෙන් කියයි.
- මෙලොව හා පරලොව දියුණුවට හේතුවන කරුණු විස්තර කරයි.
- ධනය නැසෙන දොරටු නම් කරයි.
- පරලොව දියුණුවට හේතුවන කරුණු විස්තර කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරයි.

## වැඩිදුර පරිශීලනයටඃ-

- ධර්මසේන හෙට්ටිආරච්චි - බෞද්ධ ආර්ථික දර්ශනය

# 14 පාඩම
# සිතුවිලි හඳුනා ගැනීම හා අන්‍යසමාන චෛතසික

**නිපුණතාව:- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍රධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනී.

**නිපුණතා මට්ටම:- 4.2**

- අභිධර්ම පිටකයට අයත් චෛතසික පරමාර්ථය අධ්‍යයනය කර අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. අභිධර්ම පිටකයට අයත් චෛතසික ධර්ම 52 මතකයෙන් පවසයි.
2. අභිධර්මය ද බුද්ධ දේශනාවක් ම බව පිළිගනිමින් කටයුතු කරයි.
3. අභිධර්ම පිටකයට අයත් චෛතසික 52 විස්තර කරයි.
4. අභිධර්මයට අදාළ වෙනත් ග්‍රන්ථ පරිශීලනය කරයි.
5. ධර්ම කරුණු පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- දහහතර වන පාඩම වන සිතිවිලි හඳුනාගැනීම අන්‍ය සමාන චෛතසික පාඩම කියවාගෙන එන ලෙස පෙර දිනයේ සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම අංක 1 හි සඳහන් ''ඒකුප්පාද නිරෝධා ච........'' යන ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරන්න.
- එම ගාථාව නිවරදිව සජ්ඣායනා කොට සිසුන් සමඟ ද සජ්ඣායනා කිරන්න.
- මේ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවමින් අන්‍යසමාන චෛතසික යන්න ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සිත සහ චෛතසික අතර වෙනස පැහැදිලි කර දෙන්න.
- චෛතසික 52 ක් ඇති බවත් ඒවා ඉතා සියුම්බවත් බුදු නුවණින් වෙන්කොට ඇති බවත් සාකච්ඡා කරන්න.
- චෛතසික ලක්ෂණ සතර පෙන්වා දෙන්න.
- චෛතසික ප්‍රභේද හඳුන්වා දෙන්න.
- සබ්බචිත්තසාධාරණ චෛතසික 7 වෙන වෙන ම විස්තර කරන්න.

- පකිණ්ණක චෛතසික 6 වෙන වෙන ම විස්තර කරන්න.
- අපගේ එදිනෙදා හැසිරීම්වල දී මෙම චෛතසික බලපාන අයුරු සාකච්ඡා කරන්න.
- මූලික වදන් හා සංකල්ප යටතේ සඳහන් දුරවබෝධ වචන අභ්‍යාස පොතේ සටහන් කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- සංජානාති - හඳුනාගනී
- නානාරම්මණ - නොයෙක් අරමුණු
- එකුප්පාද - සිතත් චෛතසිකත් දෙක වෙන් වෙන් ව නොව එකවිමට ම උපදී
- එකනිරෝධ - සිත නැතිව යනවිට ම චෛතසික නැති වී යයි
- එකාලම්බන - සිත ගන්නා ලද අරමුණෙහි ම චෛතසිකයත් එල්ඹගෙන සිටීම එහි ස්වභාවය යි
- එකවත්ථුක - ඇස, කණ ආදී ඉන්ද්‍රියන් ඇසුරුකරමින් ම පැවැතීම
- ද්විපඤ්ඤාස - චෛතසික පනස්දෙක
- අභිනිරොපෙති - අරමුණට නැංවීම

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- ''එකුප්පාද නිරොධා ච - ඒකාලම්බනවත්ථුකා
  චෙතොයුත්තා ද්විපඤ්ඤාස - ධම්මාචෙතසිකාමතා'' යන ගාථාව ලියන ලද පුවරුව.
- පෙළ පොතේ දහ හතරවන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- සබ්බචිත්ත හා පකිණ්ණක චෛතසික මතකයෙන් කියන්න.
- එක් එක් චෛතසිකයට අදාළ ලක්ෂණ මතකයෙන් ලියන්න.
- සිතත් චෛතසිකත් අතර වෙනස පැහැදිලි කරන්න.
- චෛතසික ලක්ෂණ හා චෛතසික ප්‍රමාණය ඇතුළත් ගාථාව කටපාඩම් කරන්න.

## වැඩිදුර පරිශීලනයටඃ-

- රේරුකානේ චන්දවිමල මහනාහිමි - අභිධර්මයේ මූලික කරුණු

# 15 පාඩම
## නරක සිතුවිලි

**නිපුණතාව:- 4.0**

- ත්‍රිපිටකාගත සූත්‍රධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මඟ සළසා ගනී.

**නිපුණතා මට්ටම:-4.2**

- අභිධර්ම පිටකයට අයත් චෛතසික පරමාර්ථය අධ්‍යයනය කර අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. අකුසල චෛතසික 14 මතකයෙන් පවසයි.
2. පෘථග්ජන අප සිත් තුළ ද අකුසල සිත් උපදින බව පිළිගනිමින් කතා කරයි.
3. අකුසල චෛතසික දහසතර විස්තර කරයි.
4. අකුසල චෛතසික මුල් වී සිදුකරන ක්‍රියාවන්ගෙන් බැහැරවීමට උත්සාහ ගනී.
5. චෛතසික ධර්ම කරුණු පිළිබඳව ද ගැඹුරින් අධ්‍යයනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පහලොස් වන පාඩම කියවාගෙන එන ලෙස සිසුන් පෙරදිනයේ දී දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- සිරිල් ඒ සීලවිමල මහතා විසින් රචිත, වික්ටර් රත්නායක සූරීන් ගායනා කරන ''මෝහෙන් මුලාවෙලා................'' යන ගීතය ඇතුළත් හඬපටයක් සූදානම් කරගෙන පන්තියට යන්න.
- ''මෝහෙන් මුලාවෙලා................'' යන ගීයත ඇතුළත් හඬපටය වාදනය කරන්න.
- එහි සඳහන් වන මෝහය, රාගය යනාදිය අකුසල චෛතසික බව ඉස්මතු කරන්න.

**පාඩම් සංවර්ධනය:-**

- අකුසල චෛතසික 14 පෙන්වා දෙන්න.
- මෝහ, අහිරික, අනොත්තප්ප යන චෛතසික විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- උද්ධච්ච, ලෝභ, දිට්ඨි චෛතසික විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- මාන, දෝස, ඉස්සා චෛතසික විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

- මච්ඡරිය, කුක්කුච්ච චෛතසික විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ථීන, මිද්ධ, විචිකිච්ඡා යන චෛතසික වෙන වෙන ම විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ඉහත සඳහන් චෛතසික තුදුස අප සිත්තුළ ද ජනිතවන බව පෙන්වා දෙන්න.
- මෙම අකුසල චෛතසික පිළිබඳ හැඳින ගැනීම තුළින් ඒවා යටපත් කිරීමට හැකියාව ලැබෙන බව සාකච්ඡා කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟානොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පහටාසිවිසො - පහර කෑ සර්පයෙකු මෙන්
- උසූයන ලක්ඛණා - ඊර්ෂ්‍යාකරන ස්වභාවය
- අනොත්තප්ප - පවට බියක් නොමැතිකම
- විඝාත - උත්සාහය හීනවීම
- ඛීයති - දොස් නැඟීම.
- ඉස්සා - ඊර්ෂ්‍යාව
- දිට්ඨි - මිථ්‍යා දෘෂ්ටිය
- විචිකිච්ඡා - සැකය (බුද්ධාදී අටතැන් කෙරෙහි සැකය)
- දොසා - ද්වේශය, තරහා
- කිච්ඡ - දුෂ්කර
- කිච්ච - කටයුත්ත

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- ''මෝහෙන් මුලාවෙලා................'' යන ගීයත ඇතුළත් හඬපටය
- පෙළ පොතේ පහළොස්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- අකුසල චෛතසික 14 අනුපිළිවෙළින් ලියන්න.
- අකුසල චෛතසිකයන්හි තේරුම් විස්තර කරන්න.
- අකුසල චෛතසික ඇති සිතක් කුසල් සිත් මගින් මුදවා ගන්නා අයුරු පැහැදිලි කරන්න.
- ''ද්වේශය විපතට මුලය'' යන මාතෘකාව යටතේ දහම් පත්‍රිකාවක් සකස්කරන්න.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- මාතර ධම්මවංස හිමි - අභිධර්ම චන්ද්‍රිකාව
- රේරුකානේ චන්දවිමල මහනාහිමි - අභිධර්මයේ මූලික කරුණු

# 16 පාඩම
## හොඳ සිතුවිලි

**නිපුණතාව:-4.0**

- ත්‍රිපිටකාගත සූත්‍රධර්ම හා චිත්ත පාරිශුද්ධියට අදාළ අභිධර්මය අධ්‍යයනය කර, ගුණාත්මක හා යථාර්ථවාදී භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 4.2**

- අභිධර්ම පිටකයට අයත් චෛතසික පරමාර්ථය අධ්‍යයනය කර අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. අභිධර්ම පිටකයට අයත් චෛතසික පරමාර්ථය විස්තර කරයි.
2. අභිධර්මයෙහි ධර්ම කරුණු ගැඹුරින් විස්තර කර ඇති බව පිළිගනිමින් කතා කරයි.
3. චෛතසික පරමාර්ථය ලැයිස්තු ගත කරයි.
4. දහම් පොතපත පරිශීලනය කරයි.
5. ජීවිතය පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි දහසය වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙසත්, සෝභන රාසියෙහි චෛතසික 25 බෙදෙන අයුරු සහ සෝභන සාධාරණ චෛතසික 19 යෙන් මුල් 05 හොඳින් කටපාඩම් කරගෙන එන ලෙසත් පෙර දිනයේ සිසුන් දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම් අංක 01 හි සඳහන් බුදුරජාණන් වහන්සේගේ ශාන්ත බව විදහාපාන වර්ණවත් පින්තූරයක් සහ දැකීමට අප්‍රිය පිළිකුල් සහගත මළමිණියක් වැනි පිංතූරයක් සහ දැකීමට ප්‍රිය කරන පිංතූර ඇතුළත් ප්‍රදර්ශනපුවරුව පෙන්වමින් එහි එක් එක් පින්තූර දකින විට සිතේ ඇතිවන ස්වභාවයන් පිළිබඳ ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- මෙම පාඩමෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද,? යන්න සාකච්ඡා කරමින් චෛතසික පිළිබඳ අදහස මතුවෙන අයුරින් සාකච්ඡා කිරීමට සිසුන් යොමු කරන්න.

**පාඩම් සංවර්ධනය:-**

- අභිධර්මයේ පරමාර්ථ ධර්ම 4ක් ඇති බවත් චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යනු ඒ සතර පරමාර්ථධර්ම බව පැහැදිලි කරන්න.
- අභිධර්මයේ දෙවන පරමාර්ථය චෛතසික පරමාර්ථය බව පැහැදිලි කරන්න.

- චිත්ත, චෛතසික යන දෙකම එකට ම ඇති වී එකට ම පැවතී එකට ම නැති වන බව පැහැදිලි වන අයුරින් උදාහරණ සහිතව සටහනක් ලියවන්න.
- දුරවබෝධ වචන පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මෙම පාඩමේ හමුවන දුරවබෝධ වචන පැහැදිලි කරමින් අභ්‍යාස පොතේ සටහනක් ලියවන්න.
- දුරවබෝධ වචන පැහැදිලි කෙරෙන ලැයිස්තුවක් පිළියෙල කරන්න.
- සෝභන චෛතසික පිළිබඳ පැහැදිලි කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධක මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් එය සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප:-**

- සෝභන චෛතසික - කුසල් සිතුවිලි
- විරති චෛතසික - වැළකීමේ සිතුවිලි
- අප්පමඤ්ඤා චෛතසික - ලොව අප්‍රමාණ සතත්වයන් අරමුණු කොට පහළවන සිතුවිලි
- පඤ්ඤා චෛතසික - මෝහයෙන් මිදි නුවණින් යුක්තව ඇතිකරගන්නා සිතුවිලි
- සද්ධා - බුද්ධාදී තුනුරුවන් පිළිබඳ අචල විශ්වාසය
- සති - නිවැරදි සිහිය
- හිරි - පාපයට හෙවත් වැරදි කිරීමට ඇති ලැජ්ජාව
- ඔත්තප්ප - පාපයට හෙවත් වැරදි කිරීමට ඇති බිය
- අලෝභ - අරමුණෙහි නොඇලෙන ස්වභාවය
- අදෝස - ද්වේෂ නැති බව, මෛත්‍රී සහගත බව
- තත්‍ර මජ්ඣත්තතා - ඒ ඒ අරමුණෙහි ඇලීම් ගැටීම් නැතිව සිතිවිලි සමව පවත්වාගැනීම
- කායපස්සද්ධි - වේදනා, සංඤ්ඤා, සංඛාර ස්කන්ධත්‍රයෙහි සංසිඳීම
- චිත්තපස්සද්ධි - සිතෙහි සංසිඳුනු බවයි
- කායලහුතා - සිතුවිලිවල සැහැල්ලු බව
- චිත්තලහුතා - සිතේ සැහැල්ලු බව
- කායමුදුතා - සිතුවිලිවල මුදු බව
- චිත්තමුදුතා - සිතුවිලිවල මුදු බව
- කායකම්මඤ්ඤතා - කුසලයෙහි ක්‍රියාශීලි බව
- චිත්තකම්මඤ්ඤතා - සිතෙහි ක්‍රියාශීලි බව
- කායපාගුඤ්ඤතා - සිතුවිලිවල ගිලන් බව දුරු කර ප්‍රගුණ බව ඇති කරයි.
- චිත්තපාගුඤ්ඤතා - කුසල් කිරීමට පෙරමුණ ගන්නා ස්වභාවය
- කායුජ්ජුකතා - අවංක බව, ඇද නැති ඍජු බව
- චිත්තුජ්ජුකතා - අවංකව, ඍජුව එකසිතින් ම කුසලයෙහි යෙදෙන ස්වභාවය ගුණාත්මක යෙදවුම්

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- පිංතූර ඇතුළත් ප්‍රදර්ශන පුවරුව
- පෙළ පොතේ දහසය වන පාඩම
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-**

- අභිධර්මයේ සතර පරමාර්ථ ධර්ම නිවැරදිව හැඳින්වීම.
- චෛතසික පරමාර්ථය විස්තර කිරීම.
- සෝභන රාශියේ චෛතසික 25 පිළිවෙළින් නිවැරදිව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- සෝභන චෛතසික පැහැදිලි කෙරෙන කෙටි ධර්ම දේශනයක් කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- අභිධර්මාර්ථ සංග්‍රහය - රේරුකානේ චන්‍දවිමල නාහිමි
- අභිධර්මයේ මූලික කරුණු - රේරුකානේ චන්‍දවිමල නාහිමි

# 17 පාඩම
## අනුවණයා හා අසත්පුරුෂයා (බාල වග්ගය)

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු චරිතයකට මග සලසාගනියි.

**නිපුණතා මට්ටම:- 5.1**

- ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරමින් ධර්ම අනුශාසනයෙහි යෙදෙයි

**කාලපරිච්ඡේද:-** 10 යි

**ඉගෙනුම්පල:-**

1. ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරයි.
2. ධම්මපද ගාථා ජීවිතාදර්ශ සපයන බව පිළිගනිමින් කතා කරයි.
3. බාල වග්ගයෙහි, එන ගාථා ලැයිස්තු ගත කර ආදර්ශ වගු සාදයි.
4. පණ්ඩිවරයෙකු ලෙස කටයුතු කරයි.
5. බාල (පහත්) කටයුතුවලින් මිදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- ධම්මපදයේ බාල වග්ගය දැක්වෙන පෙළ පොතෙහි දහහත්වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුවත් කරන්න. දිනකට එහි ගාථා 2 බැගින් අර්ථ සහිතව කටපාඩම් කරගෙන එන ලෙස ද දන්වන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම් අංක 01 හි සඳහන් "දීඝා ජාගරතො රත්ති" ගාථාව හා සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ඇතුළත් පුවරුවක් ප්‍රදර්ශනය කරමින් ශබ්දනගා නිවැරදිව සජ්ඣායනය කර සිසුන් සමඟ එක්ව සජ්ඣායනය කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- මෙම ගාථාවෙන් කියවෙන්නේ කුමක් ගැනද? යන්න සාකච්ඡා කරමින් බාලයා යනු කවරෙක්ද? ඔහුගේ ලක්ෂණ මොනවාද? යන කරුණු මතු කර ගැනීමට සිසුන් මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ ග්‍රන්ථ 15 අතරින් ධම්මපදය දෙවන ග්‍රන්ථය යන්න පැහැදිලි කරන්න.
- බුදුදහම ඉගෙනීමට අභිනවයෙන් ප්‍රවේශ වෙන කෙනෙකුට හැදෑරීමට සුදුසුම පාඨ ග්‍රන්ථය ධම්මපදය බවත්, එහි සූත්‍ර, විනය, අභිධර්ම යන පිටක තුනම නියෝජනය වන ධර්ම කරුණු ඇතුළත් බව විස්තර කරන්න.

- බාලයා යනු කවරෙක්ද, බාලයා සිතන පතන අයුරු කෙසේද, බාලයාගේ හැසිරීම කෙබඳුද, යන බාලයාගේ ලක්ෂණ පැහැදිලි කරන්න.
- එක් දිනකට ගාථා දෙකක් අර්ථ සහිතව පාඩම් කරවා පාඩම් ගන්න.
- ගාථාවේ දුරවබෝධ පද අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම දුරවබෝධ වචන එකින් එක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- ගාථා දෙකෙහි නිදානකතා දෙක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම්, ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- සත්තිස් බෝධිපාක්ෂික ධර්ම - සත්තිස්බෝධිපාක්ෂික ධර්ම නම් චතුරාර්ය සත්‍ය ඥාණය ලබා ගැනීමට උපකාර වන ධර්මයි. ඒවානම්, සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධාන වීර්යය, සතර ඍද්ධිපාද, පංචඉන්ද්‍රිය, පංචබල, සප්තබොජ්ඣංග, ආර්යඅෂ්ටාංගික මාර්ගය.
- සංසාරය- සංසාරය යනු කාම ලෝක, රූපලෝක, අරූපලෝක යන තුන් ලෝකයෙහි ඉපදීම් පිළිසිඳ ගැනීම් වශයෙන් ස්කන්ධ, ධාතු, ආයතනයන්ගේ පරපුරෙන් පරපුරට නොකැඩී, නොසිඳී, දිගින් දිගට පැවතීම වේ.
- කල්‍යාණමිත්‍රයා- කල්‍යාණමිත්‍රයා යනු තමාට වඩා සීල, සමාධි, පඤ්ඤා යන ගුණයන්ගෙන් වැඩි කෙනෙකු හෝ සමාන කෙනෙකි.
- කරුණු අවබෝධ වන ආකාර හතර -උග්ඝටිතඤ්ඤ - ඇසුණු සැණින් කරුණු අවබෝධ කර ගන්නා පුද්ගලයා උග්ඝටිතඤ්ඤ නමින් හැඳින්වේ.

  විපචිතඤ්ඤ - පුරුදු පුහුණු කිරීමෙන් හැදෑරීමෙන් කරුණු අවබෝධ කරගන්නා පුද්ගලයා විපචිතඤ්ඤ නමින් හැඳින්වේ.

  නෙය්‍යා - නිතරම පසුපස සිට කියා දෙමින් සිහිපත් කරමින් ඉතා අමාරුවෙන් කරුණු අවබෝධ කර ගන්නා පුද්ගලයා නෙය්‍යය නමින් හැඳින්වේ.

  පදපරම - මුනින් නැමූ කළයකට වතුර වක්කරන්නාක් මෙන් මෙකී කිසිම ක්‍රමයකට කරුණු අවබෝධ නොවන තැනැත්තා පදපරම නමින් හැඳින්වේ.
- විවේක තුනකි

  කායවිවේකය - ගිහි සමූහයාගෙන් මෙන්ම පැවිදි සමූහයාගෙන් ද වෙන්ව හුදකලාව විසීම කාය විවේකය යි.

  චිත්තවිවේකය - නීවරණ ධර්ම මැඩපවත්වමින් කෙලෙස්වලින් ඈත් වීම චිත්ත විවේකය යි.

  උපධිවිවේකය - සියලු සංස්කාර ධර්මවලින් මිදී රහත් බවට පැමිණීම උපධි විවේකය යි.

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- "දීඝා ජාගරතො රත්ති" යන ගාථාව සහ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක්.
- පෙළ පොතේ දහහත්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- පහත සඳහන් නිර්ණායක යොදන්න.
- ගාථා නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් ඉදිරිපත් කිරීම.
- ගාථාවේ අර්ථය සරලව පැහැදිලි කිරීම.
- නිදාන කතාව පැහැදිලිව හා සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- බාලයා පිළිබඳව හඳුන්වා දෙමින් කෙටි ධර්ම දේශනාවක් කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- ධම්මපදට්ඨකථාව
- සද්ධර්මසාගරය හෙවත් ධම්මපදවර්ණනා
- ධම්මපද විවරණය

# 18 පාඩම
## සත්පුරුෂයා (පණ්ඩිත වග්ගය)

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.1**

- ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරමින් ධර්ම අනුශාසනයෙහි යෙදෙයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම්පල:-**

1. ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරයි.
2. ධම්මපද ගාථා ජීවිතාදර්ශ සපයන බව පිළිගනිමින් කතා කරයි.
3. පණ්ඩිත වග්ගයෙහි එන ගාථා ලැයිස්තු ගත කර එහි ආදර්ශ වගු ගත කරයි.
4. පඬිවරයෙකු ලෙස කටයුතු කරයි.
5. පණ්ඩිත (යහපත්) කටයුතු වල යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- ධම්මපදයේ පණ්ඩිත වග්ගය දක්වෙන පෙළ පොතෙහි දහ අටවන වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුවත් කරන්න. දිනකට එහි සඳහන් ගාථා දෙක බැගින් අර්ථ සහිතව පාඩම් කරගෙන එන ලෙස දන්වන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම් අංක 1 හි සඳහන් ''නිධීනංව පවත්තාරං'' යන ගාථාව සහ සැරියුත් තෙරුන් සිවුරුපොට බිම ගෑවෙන බව කුඩා සාමණේරයන් වහන්සේ නමක් පෙන්වන දර්ශනය ඇතුළත් පිංතූරයක් හා නිධානයක් අත දිගු කොට පෙන්වන දර්ශනයක් ඇතුළත් පිංතූරයක් යන පිංතූර ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක්, හෝ ප්‍රදර්ශන පුවරු කීහිපයක් නිර්මාණය කර ඒවා දක්වමින් ගාථාව සජ්ඣායනා කර සිසුන් සමග සජ්ඣායනා කරමින් පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- මෙම පින්තූර මගින් දෙන පණිවුඩය කුමක්ද?
- මේ ගාථාවෙන් කියවෙන්නේ කුමක් ගැනද? යන්න සාකච්ඡා කරමින් පණ්ඩිත වග්ගයේ ඇතුළත් කරුණු පණ්ඩිතයකු පිළිබඳ අදහස මතු වන අයුරින් සිසුන්ව සාකච්ඡාවට යොමු කරන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ධම්මපදයේ පණ්ඩිත වග්ගයේ දක්වෙන පරිදි පණ්ඩිතයෙකු යනු කවුද? පණ්ඩිතයාගේ ලක්ෂණ මොනවාද? යන්න පැහැදිලි කරන්න.
- පණ්ඩිත වග්ගය ධම්මපදයේ හයවෙනි වග්ගය යන්නත් එහි ගාථා 14ක් ඇති බවත් සාකච්ඡා කරන්න.

- එක් දිනකට ගාථා දෙකක් සහ එම ගාථා දෙකෙහි අර්ථ කට පාඩම් ගන්න.
- ගාථාවේ දුරවබෝධ පද අභ්‍යාස පොතෙහි සටහන් කරගැනීමට උපදෙස් දෙන්න.
- එම දුරවබෝධ පද එකින් එක ගෙන පැහැදිලි කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- දුරවබෝධ පදවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කරගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ පද එකතුවක් හා එහි අර්ථ සඳහන් වගුවක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- එම ගාථා වල නිදානකතා පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- එම ගාථා අර්ථ, ධර්ම කරුණු, නිදාන කතා ඇතුළත් ධර්ම චින්තාවක්, කෙටි ධර්ම දේශනයක් කිරීමට අවශ්‍ය කරුණු එක් රැස් කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම්, ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- කණ්හ සුක්ක - අකුසල ධර්ම හා කුසල ධර්ම
- ඕක - ආලය ගෘහය (පංචස්කන්ධය)
- අනෝක - එයින් මිදීම
- අකිඤ්චන - කෙලෙස්, කාමවස්තු (වස්තුකාම,ක්ලේශකාම) ආදියෙන් මිදුණු කිසිවක් නැති
- සම්බෝධි අංග - සප්තබොජ්ඣංග, සත්තිස්බෝධිපාක්ෂික ධර්ම
- උපාදාන සතර - කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද
- ආදාන පටිනිස්සග්ග - පංචස්කන්ධය මමය මාගේ යැයි ගැනීම ආදාන නම් වේ පටිනිස්සග්ග යනු දුරු කිරීමයි. මෙය නිවනට කියන නමකි
  (පංචස්කන්ධය මමය, මාගේය යන ග්‍රහණය දුරුකිරීම නිසා නිවනට මේ නම කියති)

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- "නිධීනංව පවත්තාරං" යන ගාථාව ලියූ පුවරුව සහ සැරියුත් තෙරුන්ගේ සිවුරුපොට බිම ගැවෙන අයුරු පෙන්වන කුඩා සාමණේර හිමියන්ගේ පිංතූරය සහ නිධානය පෙන්වන පින්තූරය ඇතුළත් ප්‍රදර්ශන පුවරුව
- පෙළ පොතේ දහ අටවන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-**

- පහත සඳහන් නිර්ණායක යොදන්න.
- ගාථා නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් ඉදිරිපත් කිරීම.
- ගාථාවේ අර්ථය සරලව පැහැදිලි කිරීම.
- නිදාන කතාව පැහැදිලිව හා සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- පණ්ඩිත වග්ගය පිළිබඳ හැඳින්වීමක් හෝ පණ්ඩිතයෙකුගේ ලක්ෂණ පැහැදිලි කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- ධම්මපදට්ඨ කථාව
- සද්ධර්මසාගරය හෙවත් ධම්මපදවර්ණනා
- ධම්මපදවිවරණය

# 19 පාඩම
## කෙලෙසුන් නැසූ උතුමෝ

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**නිපුණතා මට්ටම:- 5.1**

- ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරමින් ධර්ම අනුශාසනයෙහි යෙදෙයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. ධම්මපද ගාථාවන්හි අර්ථ නිරුක්ති පැහැදිලි කරයි.
2. ධම්මපද ගාථා ජීවිතාදර්ශ සපයන බව පිළිගනිමින් කතා කරයි.
3. පණ්ඩිත වග්ගයෙහි හා එන ගාථා ලැයිස්තු ගත කර ආදර්ශ වගු සකසයි.
4. පඬිවරයෙකු ලෙස කටයුතු කරයි.
5. පණ්ඩිත (යහපත්) කටයුතුවල යෙදෙයි.
6. නිවැරදි සිහියෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- ධම්මපදයේ ''අරහන්ත වග්ගය'' දක්වෙන පෙළපොතෙහි දහනව වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන්ට දැනුවත් කරන්න. දිනකට එහි සඳහන් ගාථා 02 දෙක බැගින් අර්ථ සහිතව කටපාඩම් කරගෙන එන ලෙස ද දැනුම් දෙන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම් අංක 01 හි සඳහන් ''ගතද්ධිනො විසොකස්ස'' යනාදි ගාථාව සහ දෙව්දත් හිමි බුදුරජාණන් වහන්සේට ගල්පෙරලන දර්ශනය ඇතුළත් පින්තූරය සහිත පුවරුව ප්‍රදර්ශනය කරමින් ගාථාව සජ්ඣායනා කර සිසුන් සමඟද සජ්ඣායනා කරන්න. අනතුරුව පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- මෙම පින්තූරයෙන් පෙන්වන සිදුවීම කුමක්ද?
- මෙම ගාථාවන්ගෙන් කියවෙන්නේ කුමක් ගැනද?
- මේ දෙකෙහි සම්බන්ධය කෙබඳුද යන්න සාකච්ඡා කරමින් අරහන්ත වග්ගයේ රහතන් වහන්සේගේ ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න. රහතන් වහන්සේ පිළිබඳ අදහස ඉස්මතු කරගැනීමට සිසුන්ව මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ධම්මපදයේ අරහන්ත වග්ගය පිළිබඳ පැහැදිලි කරන්න.
- රහතන් වහන්සේ හඳුනා ගන්නේ කෙසේදැයි විස්තර කරන්න.
- ධම්මපදයේ 07 වන වග්ගය අරහන්ත වග්ගය බවත් පැහැදිලි කරන්න.
- දිනකට ගාථා දෙක බැගින් අර්ථ සහිතව කටපාඩම් කරවා පාඩම් ගන්න.

- ගාථාවේ දුරවබෝධ පද අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම දුරවබෝධ වචන එකින් එක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- ගාථා දෙකෙහි නිදානකතා දෙක පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම්, ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ

**මූලික වදන් හා සංකල්පඃ-**

- ගතද්ධිනෝ - සසරගමන නිම කළ
- සබ්බධී - පංචස්කන්ධය - සියලු සංස්කාරයන් (ඉන් මිදුනු රහතන් වහන්සේ මෙනමින් හැඳින්වේ.)
- සබ්බගන්ථ - සබ්බ ග්‍රන්ථ යනු සත්වයාගේ නාම, රූප, කාය, චුති, ප්‍රතිසන්ධි වශයෙන් සසර ගැට ගසන කාය ග්‍රන්ථ 4යි. එම හතර  මෙසේය. අභිජ්ඣාකායගන්ථ, ව්‍යාපාද කාය ග්‍රන්ථ, සීලබ්බතපරාමාස කායගන්ථ, ඉදං සච්චාභිනිවෙස කායගන්ථ
- අභිජ්ඣාකාය ගන්ථ - පුනර්භව හෙවත් නැවත ඉපදීම ඇති කරවන නන්දිරාගය හෙවත් සතුටු සිතින් ඇලීම ඇති කරන ලැබෙන රූපාදි අරමුණෙහි ඇති තෘෂ්ණාවයි
- සීලබ්බතපරාමාස කායගන්ථ - ආර්යඅෂ්ටාංගික මාර්ගයෙන් තොරව වෙනත් ආගම්වල දක්වෙන සීලව්‍රතවලින් සසරින් මිදිය හැකි යැයි සිතා මිථ්‍යා සිල් හා ව්‍රත අනුගමනය කිරීම
- ඉදං සච්චාභිනිවේසා කායගන්ථ - ශාස්වත උච්ඡේද දෘෂ්ටි යන අංග දෙකට අයිති මිථ්‍යා දෘෂ්ටිවලින් තමන් අදහන මතයම සත්‍යයැයිද අන් සියල්ල බොරු යයි ඇදහීමයි
- කායගන්ථ - කාය හෙවත් ශරීරය - පංචස්කන්ධ වශයෙන් සසර පැටලෙන නිසා මේවා චතුර්විධ කාය ගන්ථ නම් වේ.
- සන්නිචයෝ - රැස් කිරීමයි - රැස් කිරීම් දෙකකි. කර්ම රැස් කිරීම හා ප්‍රත්‍ය (සිව් ප්‍රත්‍ය) රැස් කිරීමයි (රහතන් වහන්සේට මේ රැස් කිරීමේ දෙකම නැත)
- සන්නිධිකාර - රැස්කොට තබා ගැනීමයි. (භික්ෂූන් වහන්සේට සන්නිධිකාර පරිභෝගය තහනම්ය)
- පරිඤ්ඤාත භෝජනා - පරිඤ්ඤා හෙවත් පිරිසිඳ දැන ගැනීම් තුනකි. ඤාත පරිඤ්ඤා තීරණ පරිඤ්ඤා, පහාන පරිඤ්ඤා
- ඤාත පරිඤ්ඤා - තමාට ලැබෙන ආහාර මොනවාද ඒවායෙහි දැහැමි නොදැහැමි බව දැන ගැනීම.
- තීරණ පරිඤ්ඤා - ආහාරයෙහි පිළිකුල් බව දැන ගැනීම
- පහාන පරිඤ්ඤා - ආහාරයෙහි ආශාව දුරුකොට නුවණින් දැන වැළඳීමයි
- ත්‍රිවිධ විමොක්ඛ - සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත
- සුඤ්ඤත විමොක්ඛ - නිර්වාණය. රාග, ද්වේශ, මෝහයන්ගෙන් තොර හෙයින් ශුන්‍යයි
- අනිමිත්ත විමොක්ඛ - නිර්වාණය රාගාදී අරමුණු නිමිති සලකුණු වලින්ද තොර බවය
- අප්පනිහිත විමෝක්ඛ - රාගාදී ප්‍රාර්ථනා වලින් රහතන් වහන්සේලා මිදුණු බවය
- ආසව - කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව. ආසව යනු සසර බොහෝ කලක් සත්ත්වයාගේ සිත් තුළ පැසව පැසවා පවතින හෙයින් මේ නම ලැබී ඇත.
- කාමාසව - රූප, අරූප වශයෙන් සසර පැවතීමට ඇති ඇල්ම
- භවාසව - ඉන්ද්‍රිය සයට ලැබෙන අරමුණු කෙරෙහි ඇතිවන කාම රාගය
- දිට්ඨාසව - පංචස්කන්ධය සහ බාහිර රූපාදී ධර්මයන් නිත්‍යය, සුභය, සැපය, ආදී වශයෙන් ආත්මයයි පවතින මිථ්‍යාදෘෂ්ටියයි

- අවිජ්ජාසව - ස්කන්ධ ධර්මයන්හි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන සැබෑ තත්වය වසාලන මෝහයයි
- මානය - මැනීමයි, එය සෙය්‍යමාන, සදිසමාන, හීනමාන, යැයි තුන් ආකාරය
- සෙය්‍යමාන - අන්‍යයන්ට වඩා තමා උසස් යැයි මැනීමයි
- සදිසමාන - අන්‍යයන් තමා හා සමානයැයි මැනීමයි
- හීනමාන - අන්‍යයන්ට වඩා තමා පහත් යැයි මැනීමයි
- ඉන්ද්‍රඛීල - රාජ්‍යයක අනුභාවය හා නගරයේ අභිමානය ප්‍රකට කරන උස්ව හා ඍජුව නගරමැද ස්ථිරව පිහිටි කුළුණකි
- තාදී, අටලෝ දහමෙන් කම්පා නොවීමේ ස්වභාවය යි
- සංසාරාන භවන්ති - නැවත සුගති දුගතිවල සැරිසැරීමක් නැති බවයි
- පංච විමුක්තිය - කෙලෙසුන්ගෙන් මිදෙන ආකාර පහකි. ඒවානම් තදංග විමුක්ති, වික්ඛම්භන විමුක්ති, සමුච්ඡේද විමුත්ති, පටිප්පස්සද්ධි විමුත්ති, නිස්සරණ විමුත්තිය
- තදංග විමුත්තිය - පහන් එළියෙන් අඳුරු දුරු කිරීම මෙන් තාවකාලිකව කෙලෙසුන්ගෙන් මිදෙන ක්‍රමයයි. එහි විපාකයන්ගෙන් කාම, භව වලින් එහාට යා නොහැකිය
- වික්ඛම්භන විමුක්තිය - සමථ භාවනාවෙන් නීවරණ මැඩ පවත්වා ධ්‍යාන උපදවා ගැනීමයි. එය දිය මතු පිට ඇති දියසෙවල් කළයෙන් තල්ලු කරන්නාක් මෙන් තාවකාලික කෙලෙස් යටපත් කිරීමකි. එයින් රූපාවචර, අරූපාවචර, බ්‍රහ්මලෝකවල විපාක ලැබේ. ධ්‍යාන පිහිටීමෙන් ආයුෂ ගෙවීමෙන් එම කෙලෙසුන්ගෙන් මිදීම අවසන් වේ
- සමුච්ඡේද විමුත්තිය - සෝවාන් ආදී මාර්ගඵල වලින් සක්කායදිට්ඨිය ආදී කෙලෙස් සහ මුලින් ම නැති කරමින්, රහත් මාර්ගයෙන් සියලු කෙලෙසුන් නැසීමයි. එය කරටිය සිඳුනු පොල් කඳක් මෙනි. නැවත ලියලා නොවැඩේ. එය ලෝකෝත්තරය, නැවත ඉපදීමක් නැත
- පටිප්පස්සද්ධි විමුත්තිය - මාර්ග සිත් වලින් කෙලෙස් නැසූ පසු ඵල සිතෙන් කෙලෙස් පුරුදු නැති කිරීමයි. එය ගිණි දල්වා තිබූ තැනක පොළවේ රශ්නය දිය ඉස නිවීමක් වැනිය
- නිස්සරණ විමුත්තිය - සසරෙන් නික්මීමයි. එනම් නිවනයි
- අස්සද්ධෝ - යනු රහතන් වහන්සේ තමන් විසින් ම සත්‍ය වටහා ගනු මිස අනුන් කී නිසා නො අදහන බවයි
- අකතඤ්ඤූ - ලෝකෝත්තර නිවන යනු නැවත සකස් වීමක් නැති හෙයින් මෙනමින් හැඳින්වේ
- සන්ධිච්ඡේදෝ - සසර ගමන නැමැති සන්ධි බිඳ දැමූ නිසා රහතන් වහන්සේ මෙනමින් හැඳින්වේ

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- "ගතද්ධිනෝ විසෝකස්ස'' ගාථාව ලියන ලද පුවරුව හා දෙව්දත් හිමි බුදුරජාණන් වහන්සේට ගල් පෙරලන දර්ශනය ඇතුළත් පිංතූරය
- පෙළ පොතේ දහ නවය පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-**

- පහත සඳහන් නිර්ණායක යොදාගන්න.
- ගාථා නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් ඉදිරිපත් කිරීම.
- ගාථාවේ අර්ථය සරලව පැහැදිලි කිරීම.

- නිදාන කතාව පැහැදිලිව හා සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- රහතන් වහන්සේගේ ලක්ෂණ පිළිබඳව "අරහන්ත වග්ගය" ඇසුරින් පැහැදිලි කිරීම. හෝ රහතන් වහන්සේ නමක් යනු කෙබඳු කෙනෙක් දැයි විස්තර කෙරෙන ධර්ම පත්‍රිකාවක් නිර්මාණය කිරීම.

**වැඩිදුර පරිශීලනයටः-**

- ධම්මපදට්ඨකථාව
- සද්ධර්මසාගරය හෙවත් ධම්මපදවර්ණනා
- ධම්මපදවිවරණය

# 20 පාඩම
## කමටහන් උගනිමු (සම සතළිස් කර්මස්ථාන)

**නිපුණතාව:- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**නිපුණතා මට්ටම:- 6.1**

- සමසතළිස් කර්මස්ථාන අධ්‍යයනය කර අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. සමසතළිස් කර්මස්ථාන විස්තර කරයි.
2. සමසතළිස් කර්මස්ථාන වැඩීමෙන් චිත්ත ඒකාග්‍රතාව ඇතිවන බව පිළිගනිමින් කතා කරයි.
3. සම සතළිස් කර්මස්ථාන අතරින් ධම්ම, සංඝ, දේවතා අනුස්සති පිළිබඳ විස්තර ලැයිස්තු ගත කරයි.
4. චිත්තඒකාග්‍රතාව ඇති කර ගනියි.
5. නිවැරදි සිහියෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි විසි වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. දසකසිණ හොඳින් කටපාඩම් කරගෙන එන ලෙසද උපදෙස් දෙන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම් අංක - 01 හි සඳහන් පරිදි පඨවිකසිණ මණ්ඩලයක් සකස්කර දක්වෙන දසඅසුභය පින්තූරයක් ගෙන) එය ප්‍රදර්ශනය කරමින් පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- මෙහි දක්වෙන්නේ කුමක්ද? මෙය භාවිත කරන්නේ කුමන කටයුත්තකට ද යන්න පැහැදිලි වන අයුරින් සාකච්ඡාව මෙහෙය වන්න. එහිදී සම සතළිස් කර්මස්ථාන යනු මොනවාදැයි මතුකර ගැනීමට සිසුන් යොමු කරවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- කර්මස්ථාන යනු මොනවාදැයි සරලව පැහැදිලි කරන්න.
- භාවනා වඩන යෝගාවචරයාට ලබා දෙන උපදෙස් කර්මස්ථාන වන බව විස්තර කරන්න.
- සමසතළිස් කර්මස්ථාන හඳුන්වා දෙන්න.

- දසකසිණ විස්තර කරන්න.
- දසඅසුභ විස්තර කරන්න.
- දසඅනුස්සති පැහැදිලි කරන්න.
- සතර බ්‍රහ්මවිහාර පැහැදිලි කරන්න.
- සතර ආරුප්ප හඳුන්වන්න.
- දසකසිණ වඩන අයුරු විස්තර කරන්න.
- දසඅසුභ වඩන අයුරු කියාදෙන්න.
- දසඅනුස්සති වැඩීමට උපදෙස් දෙන්න.
- සතරබ්‍රහ්මවිහාර වැඩීමට උනන්දු කරවන්න.
- සතරආරුප්ප වැඩීමට මග කියාදෙන්න.
- ආහාරේ පටික්කූලසඤ්ඤා භාවනාව කිරීමට මග පෙන්වන්න.
- චතුධාතුවවත්ථාන භාවනාවට උපදෙස් දෙන්න.
- එම භාවන ක්‍රම කිහිපයක් ප්‍රායෝගිකව පුහුණු කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම් වලට ළඟා නොවූ සිසුන් වේ නම්, ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පඨවිකසිණ - පොළව අරමුණු කරගෙන භාවනා කිරීම
- ආපෝකසිණ - ජලය අරමුණු කරගෙන භාවනා කිරීම
- තේජෝකසිණ - ගින්න අරමුණු කරගෙන භාවනා කිරීම
- වායෝකසිණ - සුළඟ අරමුණු කරගෙන භාවනා කිරීම
- නීලකසිණ - නිල්පාට අරමුණු කරගෙන භාවනා කිරීම
- පීතකසිණ - කහපාට අරමුණු කරගෙන භාවනා කිරීම
- ලෝහිතකසිණ - රතුපාට අරමුණු කරගෙන භාවනා කිරීම
- ඕදාතකසිණ - සුදුපාට අරමුණු කරගෙන භාවනා කිරීම
- ආලෝකකසිණ - ආලෝකය අරමුණු කරගෙන භාවනා කිරීම
- ආකාසකසිණ - ආකාසය අරමුණු කරගෙන භාවනා කිරීම
- උද්ධුමාතක - ඉදිමීගිය මළසිරුර
- විනීලක - ඉදිමී නිල්පැහැ ගැන්වුනු මළසිරුර
- විපුබ්බක - සැරව වැගිරෙන මළසිරුර
- විච්ඡිද්දක - සිදුරු වී ගිය මළසිරුර
- වික්ඛායිතක - සතුන් විසින් කඩා කා දමන ලද මළසිරුර
- වික්ඛිත්තක - සතුන් විසින් ඇද ඉහිරුණු මළසිරුර
- හත වික්ඛිත්තක - කැබලි කැබලි තැන තැන ඉසුරුණු මළසිරුර
- ලෝහිතක - ලේ වැගිරෙන මළසිරුර
- පුලවක - පණුවන් වැහුණු මළසිරුර
- අට්ඨික - ඇටසැකිලි බවට පත් මළසිරුර
- බුද්ධානුස්සති - බුදුගුණ මෙනෙහි කරමින් භාවනා කිරීම
- ධම්මානුස්සති - දහම්ගුණ මෙනෙහි කරමින් භාවනා කිරීම
- සංඝානුස්සති - මහාසංඝයාගේ ගුණ මෙනෙහි කරමින් භාවනා කිරීම

- සීලානුස්සති - තමා තුළ පිහිටියා වූ සීලය පිළිබඳ මෙනෙහි කරමින් භාවනා කිරීම
- චාගානුස්සති - තමාගේ පරිත්‍යාග ගුණය පිළිබඳ මෙනෙහි කරමින් භාවනා කිරීම
- දේවතානුස්සති - දෙවියන් තුළ ඇති යහපත් ගුණ තමා තුළ උපදවා ගනිමින් ඒ පිළිබඳ මෙනෙහි කිරීම
- උපසමානුස්සති - නිර්වාණාවබෝධයෙන් දුක් සංසිඳෙන බව මෙනෙහි කිරීම
- මරණානුස්සති - මරණය ගැන මෙනෙහි කිරීම
- කායගතාසති - මිනිස් සිරුරේ පවතින යථා ස්වභාවය මෙනෙහි කිරීම
- ආනාපානසති - ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ සිහිය පිහිටුවා ගැනීම
- ආකාසානඤ්චායතන - කසින නිමිත්ත වැනි නිමිති ඉවත් කළපසු එහි පවතින අරූපි ආකාසය අනන්තයැයි මෙනෙහි කරමින් භාවනා වැඩීම
- විඤ්ඤාණඤ්චායතනය - ආකාසය බැහැර කොට සිත අරමුණු කොට භාවනා කිරීම
- ආකිඤ්චඤ්ඤායතනය - ආකාසයත් නැත එය වැඩූ විඤ්ඤාණයත් නැත දූන් කිසිවත් නැතැයි මෙනෙහි කරමින් භාවනා කිරීම
- නේවසඤ්ඤානාසඤ්ඤායතනය - ඒ විඤ්ඤාණ ආරම්මණයද දුරුකොට සඤ්ඤාවක් ඇත්තේත් නැතැයි නැත්තේත් නැතැයි භාවනා කිරීම
- ආහාරේ පටික්කූලසඤ්ඤා - ශරීරයේ පැවැත්මට ගන්නා කබලිංකාර ආහාරයෙහි පිළිකුල් බව මෙනෙහි කිරීම
- චතුධාතු වවත්‍ථාන - ජීව, අජීව සියල්ල පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු වශයෙන් සතරකට බෙදමින් යෝනිසෝමනසිකාරයෙන් බැලීම

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- සකස් කර ගන්නා ලද කසිණ මණ්ඩලය.
- පෙළ පොතේ විසිවන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-**

- පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.
- සමසතළිස් කමටහන් සංඛ්‍යාව ද සමග මතකයෙන් කීම.
- සමසතළිස් කර්මස්ථාන එකින් එක පැහැදිලි කිරීම.
- කර්මස්ථාන වඩන අයුරු හා ඉන් චිත්තඒකාග්‍රතාව ඇතිවන අයුරු විස්තර කිරීම.
- භාවනා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල පැහැදිලි කිරීම හා සමසතළිස් කර්මස්ථාන ලයිස්තුවක් පිළියෙල කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- මහා සතිපට්ඨාන සූත්‍රය

# 21 පාඩම
## සිත එකඟ කරන හැටි

**නිපුණතාව:- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**නිපුණතා මට්ටම:- 6.2**

- සමථ භාවනාව විධිමත්ව අධ්‍යයනය කර, තම ජීවිතය සාර්ථක කර ගනියි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම්පල:-**

1. සමථ භාවනාව සිදු කරන ආකාරය පැහැදිලි කරයි.
2. චිත්තඒකාග්‍රතාව සාර්ථක ජීවිතයකට මග සලසන බව පිළිගනිමින් විස්තර කරයි.
3. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල ලැයිස්තු ගත කරයි.
4. නිවැරදි කාය, වාග්, මනෝ, කර්මයෙන් යුතුව කටයුතු කරයි.
5. සදාචාරවත් ජීවිතයකට මග සලසා ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- සමථ භාවනාව ඇතුළත් පෙළපොතෙහි විසිඑක් වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන් පෙර දිනයේ දැනුම්වත් කරන්න. පාඩමෙහි දුරවබෝධ තැන් සහ දුරවබෝධ වාක්‍ය හෝ වචන ලකුණු කරගෙන පැමිණීමට උපදෙස් දෙන්න.

II ප්‍රවේශය

- සමථ භාවනාව පැහැදිලි කිරීමට යෝග්‍ය පාලි පාඨයක් වන "පංචනීක ධම්මේ සමෙතීති සමථෝ" යන පාඨය සහිතව භික්ෂූන් වහන්සේ නමක් භාවනා වඩන පින්තූරයක් ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් ප්‍රදර්ශනය කරමින් පහත සඳහන් ප්‍රශ්න අසමින් සිසුන්ට අදාළ පාඩම පැහැදිලි වන අයුරෙන් සාකච්ඡාව මෙහෙය වන්න.
- මේ පාලි පාඨයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳවද සමථ භාවනාව වඩන්නේ කෙසේද?
- සමථ භාවනාවෙන් සිදු කළ හැක්කේ කුමක්ද? සමථ භාවනාවේ ප්‍රතිඵල මොනවාද? යන කරුණු සාකච්ඡා කරමින් සමථ භාවනාවෙ පැහැදිලි වන අයුරින් සිසුන් සමග සාකච්ඡාව මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සමථ භාවනාව සමාධි භාවනාව යනුවෙන්ද හඳුන්වන්නේ සිතේ සමාධිය ඇති කර ගැනීමට සමථ භාවනාව ඉවහල් වන නිසා බව පැහැදිලි කරන්න.
- සිත රාගාදී කෙලෙස් වලින් කිලිටි නොවූ ශාන්ත කුසල් අරමුණක බොහෝ වේලාවක් රඳවා තබා ගැනීම සමථ භාවනාවෙන් සිදු කෙරෙන අයුරු විස්තර කරන්න.
- සිතට බාහිරින් පැමිණෙන අරමුණු නිසා සිත කිලිටි වන බව පැහැදිලි කරන්න.
- පංචනීවරණ ධර්මවලින් නිවන් මාර්ගය සිත ආවරණය කොට තිබෙන බව පැහැදිලි කරන්න.

- පංචනීවරණ ධර්මවලින් සිත ආවරණය වන අයුරු පැහැදිලි කරන්න.
- මෙම පංච නීවරණ යටපත් කිරීමෙන් විසිරී ඇති සිත සමථයෙන් සමාධි කර ගත හැකි බව විස්තර කරන්න.
- සමාධිගත කර ගත් සිතෙන් ප්‍රථම, ද්වීතිය, තෘතීය, චතුර්ථ යන රූපාවචර හා අරූපවචර ධ්‍යාන උපදවා ගත හැකි බවත් අෂ්ටසමාපත්තීන් ද පංචඅභිඥා ද උපදවා ගත හැකි අයුරු විස්තර කරන්න.
- මෙම භාවනා කිරීමට සුදුසු ආචාර්යවරයෙකු තෝරා ගත යුතු බවත්, එසේ තෝරා ගැනීමේ දී කම්මට්ඨානාචාර්යවරයා සතු ගුණාංග පිළිබඳවද සැලකිලිමත්විය යුතු බවත් පැහැදිලි කරන්න.
- කම්මට්ඨානාචාර්යවරයා විසින් විවිධ පුද්ගල චරිත හඳුනාගෙන එම චරිතවලට අනුව කමටහන් දීමත් සිදුවන බව පැහැදිලි කරන්න.
- භාවනා කිරීමට සුදුසු සේනාසනයක් තෝරා ගැනීම ද වැදගත් වන්නේ දසවිධ පළිබෝධයන්ගෙන් දුරුවීම භාවනා වැඩීමට පහසුවක් වන බව විස්තර කරන්න.
- මෙ සියලු කරුණු සපුරා ගෙන සමථ භාවනාවට එළඹීම භාවනාව සාර්ථක වීමට බලපාන බව පැහැදිලි කරන්න.
- මෙකී කරුණු ඔස්සේ අදාළ කාලච්ඡේද සංඛ්‍යාව අනුව සාකච්ඡාව මෙහෙය වන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම්, ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පංචනීවරණ - කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා
- රූපාවචර ධ්‍යාන 4 - ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතියධ්‍යානය, චතුර්ථධ්‍යානයයි
- අරූපාවචරධ්‍යාන 4 - ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන
- අෂ්ටසමාපත්ති - යනුද මෙකී රූපාවචර ධ්‍යාන 4 හා අරූපාවචර ධ්‍යාන 4 යි
- පංචඅභිඤ්ඤා - ඉද්ධිවිධ ඤාණය - විවිධ වූ ඍද්ධිබල පෑ හැකි නුවණ
- දිබ්බසෝත ඤාණය - පියවි කණින් ඇසිය නොහැකි දිව්‍යලෝකවල ආදී බොහෝ දුර ඇති ශබ්ද පවා ඇසීමේ නුවණ
- පරචිත්ත විජානන ඤාණය - පරසිත් දන්නා නුවණ
- පුබ්බේනිවාසානුස්සති ඤාණය - පෙර ආත්ම භාව සිහිකිරීමේ නුවණ
- දිබ්බචක්ඛු ඤාණය - පියවි ඇසින් දැකිය නොහැකි දිව්‍යලෝක ආදී ඉතා දුර දේද දැකිය හැකි නුවණ
- භාවනා කමටහන් දීමේදී තෝරාගත යුතු චරිත වර්ග හය රාග චරිත, සද්ධා චරිත, දෝෂ චරිත, බුද්ධි චරිත, මෝහ චරිත, විතක්ක චරිත,
- එම චරිතවලට ගැලපෙන කමටහන්
  රාග චරිතය - දස අසුභය, කායගතාසතිය
  දෝස චරිතය - සතර බ්‍රහ්මවිහාර, වර්ණකසිණ සතර
  මෝහ හා විතර්ක චරිත - ආනාපාන සතිය

සද්ධා චරිතය - බුද්ධ, ධම්ම, සංඝ, සීල, චාග, දේවතා අනුස්සති යන
බුද්ධි චරිතය - මරණානුස්සති, උපසමානුස්සති, ආහාරේ පටිකූලසඤ්ඤා,
ධාතුමනසිකාර

- දසවිධ පළිබෝධ

  ආවාස - ආවාසය පිළිබඳ වගකීම හෝ අපේක්ෂා තිබීම.

  කුල - ඥාති කුල, දායක කුල, ආදීන් සමීපව ඇසුරු කිරීම

  ලාභ - සිව්පසය අධිකව ලැබෙන විට ආශාව ඇති වීම, රැකබලා ගන්නට වීම, අනුමෝදනා කටයුතු අධික වීම.

  ගණ - තමා හමුවීමට එන පිරිස්, කණ්ඩායම් බහුල වීම.

  කර්ම - නව ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු ආදිය බහුල වීම.

  අද්ධාන - නිතර නිතර ගමන් බිමන් යාමට පුරුදු වීම.

  ඥාති - ගිහි ඥාතීන්ගේ හෝ එකට සිටින පිරිසගේ රෝග ආදී නොයෙක් කටයුතු වලට පිළියම් සොයන්නට වීම ආදී කටයුතු.

  ආබාධ - තමන් නිදන්ගත රෝගාබාධ කෙනෙකු වීම.

  ග්‍රන්ථ - පොත්පත් ලිවීම ආදී ලේඛන කටයුතුවල නිරත වීම.

  ඉද්ධි - ලැබූ සෘද්ධි රැක ගැනීමට වෙහෙස වීම.

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- "පංචනීක ධම්මේ සමෙතීති සමථො" යන පාඨය ලියූ හා භික්ෂූන් වහන්සේ නමක් භාවනා කරන පින්තූරය ඇතුළත් ප්‍රදර්ශන පුවරුව.
- පෙළ පොතේ විසි එක පාඩම
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-**

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- සමථ භාවනාව හා එය සිදු කරන ආකාරය පැහැදිලි කිරීම.
- චිත්තඒකාග්‍රතාවෙන් කරන කටයුතු සාර්ථක බව, නිදසුන් දක්වමින් පැහැදිලි කිරීම.
- සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල ලයිස්තුවක් සැකසීම.
- නිවැරදි කාය, වාග්, මනෝ කර්ම තුළින් සදාචාරවත් ජීවිතයක් ගොඩනගා ගැනීමට සමථ භාවනාව ඉවහල් වන අයුරු පැහැදිලි කරමින් ධර්ම පත්‍රිකාවක් හෝ පුවත් පතකට ලිපියක් සකස් කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- සතිපට්ඨාන සූත්‍රය

# 22 පාඩම
## බුදුමග පහන් එළි

**නිපුණතාව:- 7.0**

- බුදුසමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව ලෝක ධර්මතා හමුවේ නොසැලී ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම:- 7.1**

- මූලික බෞද්ධ ඉගැන්වීම්වල සුවිශේෂී බව අධ්‍යයනය කර, අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම්පල:-**

1. බුදුදහමේ මූලික ඉගැන්වීම් පැහැදිලි කරයි
2. බුදුදහමේ මූලික ඉගැන්වීම් තුළින් දහම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දෙන බව පිළිගනිමින් විස්තර කරයි.
3. බුදුදහමේ මූලික ඉගැන්වීම් වලට උදාහරණ දක්වමින් ඒවා ලැයිස්තු ගත කරන්න.
4. ජීවන ගැටලු විශ්ලේෂණාත්මකව විග්‍රහකොට විසඳා ගනියි
5. අභියෝග ජය ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි චතුරාර් සත්‍ය පිළිබඳ සඳහන් විසිදෙවන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙසත් චතුරාර්යසත්‍ය පැහැදිලි කෙරෙන පාලි පාඨයන් ද කටපාඩම් කරගෙන එන ලෙසත් පෙර දිනයේදී ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම - 01 හි සඳහන් "චතුරාර්ය සත්‍ය" හා "ආර්ය අෂ්ටාංගික මාර්ගය" සඳහන් ප්‍රදර්ශන පුවරුව පෙන්වමින් චතුරාර්ය සත්‍ය පිළිබඳ සරලව සිසුන්ට පැහැදිල වන අයුරින් පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- චතුරාර්ය සත්‍ය සඳහන් වන්නේ කුමන දේශනාවකද?
- චතුරාර්ය සත්‍ය දක්වෙන මූලාශ්‍රය මොනවාද? යන ප්‍රශ්න අසමින් චතුරාර්ය සත්‍ය පැහැදිලිවන අයුරින් හා සරල අවබෝධයක් ලබා ගැනීමට හැකි වන අයුරින් සිසුන් හා එක්ව සාකච්ජාව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් සංයුත්තනිකායේ ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ චතුරාර්යසත්‍ය ඇතුළත්ව ඇති බවත්, එය බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනය වන බවත් විස්තර කරන්න.

- දුක්ඛ ආර්යසත්‍ය, දුක්ඛසමුදය ආර්යසත්‍යය, දුක්ඛ නිරෝධ ආර්යසත්‍යය, දුක්ඛ නිරෝධ ගාමිණිපටිපදා ආර්යසත්‍යය, යනු චතුරාර්ය සත්‍ය බව පැහැදිලි කරන්න.
- ආර්ය සත්‍ය හතර එකින් එක සරලව සවිස්තරව පැහැදිලි කරන්න.
- ආර්ය සත්‍ය ප්‍රකාශිත පාලි පාඨයන් කටපාඩම් කරවා. පාඩම් ගන්න.
- පරිඤ්ඤෙය්‍යං, පහාතබ්බ, සච්ඡිකාතබ්බ, භාවේතබ්බ යන පාලි වචන පැහැදිලි කර සරලව විස්තර කරන්න.
- චතුරාර්ය සත්‍යය, සත්‍ය ඤාණ, කෘත්‍ය ඤාණ, කෘත ඤාණ වශයෙන් විස්තර කර දීම.
- ආර්ය අෂ්ටාංගිකමාර්ගය සීල, සමාධි, පඤ්ඤා වශයෙන් බෙදා විස්තර කරමින් චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගත හැකි මාර්ගය මෙය බව පැහැදිලි කර දෙන්න.
- පටිච්චසමුප්පාදය යනු බුදුදහමේ ප්‍රධාන ඉගැන්වීමක් බවත් මෙහි දැක්වෙන හේතුඵල දහම තුළින් මෙලොව සැබෑ තත්වය වටහා දෙන බවත් පැහැදිලි කරන්න.
- පටිච්චසමුප්පාදයට න්‍යායාත්මක පදනමක් ඇති බව විස්තර කරන්න.
- ලෝකයේ කොතෙක් ආගම් තිබුණද ඒ එකම ආගමකින්වත් දුකට නියම හේතුව පැහැදිලි නොකරන බවත් එනිසා ලොව සැබෑ තත්වය නොදැක සත්ත්වයන් අතරමංව සිටින බවක් විස්තර කරන්න.
- කර්මය බුදුදහමේ තවත් ප්‍රධාන ඉගැන්වීමක් වන බවත්, එහෙත් සියල්ල සිදුවන්නේ කර්මයෙන් ම නොවන බවත් පැහැදිලි කරන්න.
- නියාමධර්ම අතර කර්ම නියාමය යනු එකක් පමණක් වන බවත් රෝග කාරක හේතු අතර කර්මය ද එක් හේතුවක් පමණක් වන බව ගිරිමානන්ද සූත්‍රයේ දැක්වෙන බවත් විස්තර කරන්න.
- කර්මය කුසල අකුසල වශයෙන් දෙපැත්තකට බෙදෙන බවත්, කර්මය සිදු කිරීමට සිත, කය, වචනය යන තුන් දොරින්ම පුළුවන් බව පැහැදිලි කරන්න.
- පුනර්භවයට කර්මයේ සෘජු බලපෑමක් ඇති බවත් බුදු, පසේබුදු, මහරහත් උතුමන් කර්ම රැස් නොකරන බවත් පැහැදිලි කරන්න.
- පුනර්භවයට තෘෂ්ණාව හේතුවන බව පැහැදිලි කරන්න.
- කර්මය හා තෘෂ්ණාව නොසිඳී පවතින තුරු පුනර්භවය සිදුවන බව පැහැදිලි කරන්න.
- චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් මේ සියල්ල නැති වී නිර්වාණය සාක්ෂාත් කරගත හැකි බව විස්තර කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායක වලට අදාලව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම්, ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- දුක්ඛ ආර්යසත්‍ය - දුක පැහැදිලි කිරීම
  දුක්ඛසමුදය ආර්යසත්‍ය - දුකට හේතුව පැහැදිලි කිරීම
  නිරෝධ ආර්යසත්‍යය - දුක නැති කිරීම
  දුක්ඛ නිරෝධගාමිණි පටිපදා ආර්යසත්‍යය - දුක නැති කිරීමේ මාර්ගය පැහැදිලි කිරීම
- සෝපදිසේස නිර්වාණය - කෙලෙස් නැති කිරීම හෙවත් කෙලෙසුන්ගේ පිරිනිවීම
- අනුපදිසේස නිර්වාණය - (ජීවිතය බිඳියාම ජීවිතය අවසාන වීම) මරණය හෙවත් පිරිනිවන් පෑම
- නියාමධර්ම - උතුනියාම - ඍතු නියාමය හෙවත් කාලගුණය දේශගුණයෙහි බලපෑම
  බීජ නියාම - බීජයකින් පැලයක් හට ගැනීම මෙන් යම් උප්පත්තිය බීජයන්ගෙන් සිදු වීම
  චිත්ත නියාම - සිත මුල් වී හොඳ හෝ නරක ක්‍රියාවන් කිරීම. හොඳ කෙනෙකු හිත නරක් වී නරක වැඩක් කිරීම. නරක අයෙකු හොඳ වී හොඳ වැඩක් කිරීම

ධම්ම නියාම - ඉර හඳ පෑයීම, උපන් සත්ත්වයා මරණයට පත් වීම වැනි ලෝකයේ කිසිවෙකුට වෙනස් කළ නොහැකි ධර්මතා

කම්ම නියාම - අප කළ කුසල් අකුසල් කර්මවලට විපාක විඳීමට සිදුවීම.

- දස කුසල් 10

1. දානය
2. ශීලය
3. භාවනා
4. අපචායන (පිදිය යුත්තන් පිදීම)
5. වෙයියාවච්ච (පිදිය යුතු උතුමන්ට හා පූජනීය වස්තූන්ට පිළිවෙත් කිරීම)
6. පත්තිදාන (පිංකම් කොට පිං අනුමෝදන් කිරීම)
7. පත්තානුමෝදනා (තවත් අයෙකු කරන පිංකම් දැක සතුටු වීම)
8. ධම්මසවණ
9. ධම්මදෙසනා
10. දිට්ඨිජුකම්ම (ධර්මය කෙරෙහි නිවැරදි වැටහීමක් ඇති කර ගැනීම

- දස අකුසල් - ප්‍රාණඝාත. අදත්තාදාන, කාමමිථ්‍යාචාර (කයින් සිදුවන අකුසල්)
  මුසාවාදය, පරුෂවචනය, පිසුණාවාචය, සම්පප්ප්‍රලිපය වචනයෙන් සිදුවන අකුසල්

- අභිධ්‍යා (විෂම ලෝභය) ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි (සිතින් සිදුවන අකුසල්)

## ගුණාත්මක යෙදවුම්:-

ඇමුණුම 01

- චතුරාර්යසත්‍ය හා ආර්ය අෂ්ටාංගිකමාර්ගයේ සඳහන් ප්‍රදර්ශන පුවරුව
- පෙළ පොතේ විසි දෙක පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායක:-

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- චතුරාර්යසත්‍ය පැහැදිලි කෙරෙන පාලි වාක්‍ය අර්ථ සහිතව එකින් එක කටපාඩමින් කීම.
- චතුරාර්යසත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පංච නියාම ධර්ම, දස කුසල්, දස අකුසල් මතකයෙන් කීම.
- චතුරාර්යසත්‍යය උදාහරණ සහිතව වාචිකව හෝ ලිඛිතව විස්තර කිරීම.
- ජීවන ගැටලු විසදා ගැනීමට බුදුදහමේ මූලික ඉගැන්වීම් වලින් මග පෙන්වන අයුරු විස්තර කරන පොත් පිංචක් නිර්මාණය කිරීම.

## වැඩිදුර පරිශීලනයට:-

- ධම්මචක්කප්පවත්තන සූත්‍රය
- ගිරිමානන්ද සූත්‍රය

# 23 පාඩම
## ලෝකයේ ප්‍රධාන ලක්ෂණ තුන

**නිපුණතාව:-7.0**

- බුදුසමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව ලෝක ධර්මතා හමුවේ නොසැලී ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම:- 7.2**

- බෞද්ධ ත්‍රිලක්ෂණ ධර්මය හදාරා අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. ත්‍රිලක්ෂණ ධර්ම පැහැදිලි කරයි.
2. සියලු සත්ත්වයින් ත්‍රිලක්ෂණ ධර්මයන්ට යටත් බව පිළිගනිමින් කටයුතු කරයි.
3. ත්‍රිලක්ෂණය මුල්කර ගනිමින් අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්මානුශාසනාවක් සිදු කරයි.
4. ලොව යථාර්ථය තේරුම්ගෙන අකම්පිතව ක්‍රියා කරයි.
5. අටලෝදහම හමුවේ අවබෝධයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- 23 වන පාඩම කියවාගෙන එන ලෙස පෙර දිනයේ සිසුන්ව දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- මහගමසේකර මහතා විසින් රචිත, අමරදේව සූරීන් ගායනා කරන ''සන්නාලියනේ සන්නාලියනේ........'' යන ගීයතය සිසුන්ට ඇසීමට සලස්වන්න.
- එහි සඳහන් වන සංස්කාරයන්ගේ ප්‍රධාන ලක්ෂණ වූ ඇතිවීම, පැවතීම, නැතිවීම ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ත්‍රිලක්ෂණය යන්න හඳුන්වන්න.
- අනිච්චතාව පැහැදිලිකර දෙන්න.
- දුක්ඛ, දුක්ඛදුක්ඛ, විපරිණාමදුක්ඛ යන්න පැහැදිලි කර දෙන්න.
- සංඛාර දුක්ඛ පැහැදිලි කර දෙන්න.
- සංස්කාරයන්ගේ ලක්ෂණ සාකච්ඡාවට බඳුන් කරන්න.
- අනත්ත යන්න පැහැදිලි කර දෙන්න.
- ත්‍රිලක්ෂණය මෙලොව සෑම දෙයකට ම පොදුබව පෙන්වා දෙන්න.
- ත්‍රිලක්ෂණය යනු බුදුදහමේ මූලික ඉගැන්වීමක් බව පැහැදිලි කරන්න.
- බුදුසමයේ මූලික සිද්ධාන්තයක් ලෙස ත්‍රිලක්ෂණයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- උප්පාදො පඤ්ඤායති - ඉපදීම පෙනෙයි
- විපරිණාම - වෙනස්වීම
- පීලනාර්ථ - පීඩාකාරී
- අදුක්ඛමසුඛ - මැදහත්, (සැපත් නැති දුකත් නැති)
- සම්මුති - සම්මුතියක්, ව්‍යවහාරයක්
- සංස්කාර - රැස්කිරීම
- යම්පිච්ඡං - යං + අපි + ඉච්ඡං - යමක් කැමති වේ ද
- තදනත්තා - තං + අනත්තා - එය අනාත්මයි
- තම්පි - තං + අපි - එය ද

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- ''සන්නාලියනේ සන්නාලියනේ........'' යන ගීතය ඇතුළත් හඬපටය
- හඬපටය වාදනය කිරීමට අවශ්‍ය විද්‍යුත් උපකරණයක්
- පෙළ පොතේ විසිතුන්වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-**

- සංස්කාරයන්ගේ මූලික ලක්ෂණ මොනවාදැයි හඳුන්වන්න.
- බුදුදහමේ ත්‍රිලක්ෂණය විස්තර කරන අයුරු පහදන්න.
- ලොව සෑම දෙයක් ම ත්‍රිලක්ෂණයට යටත් බව සනිදර්ශනව සනාථකරන්න.
- ''ලොව සෑම ගැටුමකට ම මුල ආත්ම දෘෂ්ටියයි'' මේ පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- අනත්තලක්ඛණ සූත්‍රය
- මාපලගම සෝමිස්සර හිමි - බුද්ධධර්මය
- කොස්වත්තේ අරියවිමල හිමි - උසස් පෙළ බුද්ධධර්මය

# 24 පාඩම
## සසර බැඳ තබන බැම් දහය

**නිපුණතාව:-7.0**

- බුදුසමයේ මූලික ඉගැන්වීම් විචාරාත්මකව අධ්‍යයනය කර සත්ත්වයාගේ හා ලෝකයේ යථාර්ථය පිළිබඳ අවධිකමින් යුතුව ලෝක ධර්මතා හමුවේ නොසැලී ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම:- 7.3**

- දසසංයෝජන ධර්මයන් ඉගෙන අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. දසසංයෝජන ධර්මයන් මතකයෙන් කියයි.
2. දසසංයෝජන ධර්මයන් නිවනට බාධාවක් බව පිළිගනිමින් කතා කරයි.
3. සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ගඵල අවබෝධයේ දී දසසංයෝජන ධර්මයන් ප්‍රහීණවන ආකාර පිළිගනිමින් කටයුතු කරයි.
4. දසසංයෝජන ධර්මයන් ප්‍රහීණ කිරීමට උත්සාහ ගනී.
5. සංයෝජන ධර්මයන් ප්‍රහීණ කරවීමට අන් අයට උපදෙස් දෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙර දිනයේ සසර බැඳ තබන බැම් දහය නමැති විසිහතර වන පාඩම කියවාගෙන එන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- දසසංයෝජන පිළිවෙළින් ලියන ලද පුවරුව පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- දසසංයෝජන ප්‍රදර්ශනය කළ පුවරුවේ ඇති සංයෝජන පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවමින් දසසංයෝජන යන්න ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සංයෝජන පිළිබඳ මූලික හැඳින්වීම සිදුකරන්න.
- මෙම දස සංයෝජන ධර්ම ඕරම්භාගීය හා උද්ධම්භාගීය යැයි ප්‍රභේද දෙකක් ඇතිබව පෙන්වා දෙන්න.
- සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සෝවන් වීමේ දී ක්ෂය වන සංයෝජන ධර්ම ත්‍රය විස්තර කරන්න.
- කාමරාග හා පටිඝ යන අනාගාමී වීමේ දී ක්ෂය වන සංයෝජනද්වය විස්තර කරන්න.
- නිර්වාණාවබෝධයේ දී රූපරාග, අරූපරාග, මාන, උද්දච්ච, අවිජ්ජා යන උද්ධම්භාගීය සංයෝජන පඤ්චකය ක්ෂය වන බව විස්තර කරන්න.

- නිර්වාණය අවබෝධ කිරීමේ දී පියවරෙන් පියවර සංයෝජන ධර්ම ක්ෂයවන අයුරු පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- සුඛරානි - පහසු
- අසාධූනි - නරක දේ
- සුසංබුධො - අවබෝධ කිරීමට පහසු
- කඞ්කති - සැක කිරීම
- උපාදාන - දැඩිව අල්ලා ගැනීම
- අත්තනො - තමාගේ
- පරම දුක්බර - අතිශයින් දුෂ්කර
- අජවූත - එළුවෙකු වැනි හැසිරීම් ඇති
- ඕරම්භාගීය සංයෝජන - කාමලෝකවල උපත ලබාදෙන බැඳීම්
- උද්ධම්භාගීය සංයෝජන - රූප අරූප ලෝකවල උපත ලබාදෙන බැඳීම්

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- දසසංයෝජන පිළිවෙළින් ලියන ලද පුවරුව
- පෙළ පොතේ විසිහතරවන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- දසසංයෝජන ධර්ම පිළිවෙළින් විස්තර කරයි.
- මාර්ගඵල අවබෝධයේ දී දස සංයෝජන ධර්ම පිළිවෙලින් ක්ෂය වන අයුරු පහදන්න.
- මිථ්‍යා දෘෂ්ටිකයෙකුහට ඇතිවන සැක අට පහදන්න.
- ''සසර දික්වන්නේ සංයෝජන ධර්ම නිස යි'' අදහස් දක්වන්න.

## වැඩිදුර පරිශීලනයටඃ-

- රේරුකානේ චන්දවිමල මහනාහිමි - අභිධර්මයේ මූලික කරුණු
- අත්තුඩාවේ රාහුල මහනාහිමි - විචිත්‍ර ධර්මදේශනා.

# 25 පාඩම
## බුදුන් දවස දඹදිව වෙනස

**නිපුණතාව:- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින බෞද්ධ ආගමික වත් පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනී.

**නිපුණතා මට්ටම:- 8.1**

- බුද්ධකාලීන භාරතීය ආගමික හා සාමාජික තත්ත්වය ඉගෙන අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:-**

1. ෂට්ශාස්තෘවරු හා ඔවුන්ගේ ඉගැන්වීම් මතකයෙන් කියයි.
2. දෙසටක් මිසදිටු ඉගැන්වීම් පරදා බුදුසමය ඉදිරියට පැමිණි බව පිළිගනිමින් කතා කරයි.
3. ෂට්ශාස්තෘවරුන්ගේ මූලික ඉගැන්වීම් වෙන් වෙන්ව විස්තර කරයි.
4. ශාස්වත හා උච්ඡේදවාදවලින් මිදී මධ්‍යමප්‍රතිපදාවේ යෙදීමට උත්සාහ ගනී.
5. මිථ්‍යාදෘෂ්ටියෙන් බැහැරව කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙර දිනයේ ''බුදුන්දවස දඹදිව වෙනස'' නමැති විසිපස් වන පාඩම කියවාගෙන එන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- ෂට්ශාස්තෘන්ගේ නම් සහ ඔවුන්ගේ දර්ශනවාද ලියූ පුවරුව පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ක්‍රි.පූ. හයවන සියවසේ දී භාරතයේ දෙසැටක් මිසදිටු තිබූ බව ඉස්මතු කර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුද්ධකාලීන භාරතීය සමාජයේ ෂට්ශාස්තෘවරු යැයි බලවත් ආගමික නායකයින් පිරිසක් සිටි බව පෙන්වා දෙන්න.
- පූර්ණකාශ්‍යපගේ අකිරියවාදය විස්තර කරන්න.
- මක්ඛලීගෝසාලගේ නියතිවාදය විස්තර කරන්න.
- අජිතකේශකම්බලගේ අකිරියවාදය හා උච්ඡේදවාදය විස්තර කරන්න.
- පකුධකච්චායනගේ සප්තපදාර්ථවාදය විස්තර කරන්න.

- සංජයබෙල්ලට්ඨිපුත්තගේ අමරාවික්ඛේපවාදය විස්තර කරන්න.
- නිගණ්ඨනාථපුත්තගේ පරමඅවිහිංසාවාදය විස්තර කරන්න.
- ඔවුන් අතර ඇතැමුන්ගේ ඉගැන්වීම් සත්ත්වයා සසර දුකට ම ඇද දමන බව පෙන්වා දෙන්න.
- ෂට්ශාස්තෘවරු පිළිබඳ කරුණු ඇතුළත් සූත්‍ර දේශනා පිළිබඳ දැනුම්වත් කරන්න.
- ෂට්ශාස්තෘවරුන්ගේ දර්ශනවාද හැරුණු විට තවත් දර්ශනවාද තිබූ බවත් පෙන්වා දෙන්න.
- එම දර්ශනවාද සියල්ල ප්‍රතික්ෂේප කළ ද එම දර්ශවල ඇතුළත් ඇතැම් වැදගත් ධර්මතා බුදුදහම ප්‍රතික්ෂේප නොකළ බවත් පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ගණාචරියො - බොහෝ පිරිසකට ආචාර්ය වූ
- පුබ්බේකතහේතුවාද - සියල්ල පෙර කරන ලද දේ ලෙස සැලකීම
- කේශකම්බල - කෙස්වලින් සෑදූ ඇඳුමක් ඇඳ සිටි කෙනා
- ඊශ්වර නිර්මාණවාදය - දෙවියන් විසින් සියල්ල නිර්මාණය කළ බව පිළිගැනීම
- ශ්වේතාම්බර - කුඩා සුදු රෙදිකඩක් හැඳ සිටි නිගණ්ඨයින්
- දිගම්බර - නිර්වෂත්‍රව සිටි නිගණ්ඨ පිරිස්
- නිගණ්ඨ - (කෙලෙස් ගැට රහිත) නිර්වස්ත්‍රව සිටි පිරිසක්
- පකුධ - කුඹුක් ගස
- බෙල්ලට්ඨිපුත්ත - මිණී ඇට මාලයක් කරේ දමාගෙන සිටි

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- ෂට්ශාස්තෘන්ගේ නම් සහ ඔවුන්ගේ දර්ශනවාද ලියූ පුවරුව
- පෙළ පොතේ විසිපස් වන පාඩම.
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- ෂට්ශාස්තෘවරු හා ඔවුන්ගේ දර්ශනවාද නම් කරයි.
- ෂට්ශාස්තෘවරුන්ගේ දර්ශනවාද විස්තර කරයි.
- බුද්ධකාලීන භාරතයේ බොහෝ දර්ශනවාද තිබූ අතර ඒවා අභිබවා බුදුදහම ඉදිරියට පැමිණීමට හේතුව පැහැදිලි කරයි.
- මිසදිටු ආගම්වාද පිළිබඳ විස්තර ඇතුළත් සූත්‍ර නාමාවලියක් සකස් කරයි.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- බ්‍රහ්මජාල සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය, මහා සකුළුදායි යනාදී ෂට්ශාස්තෘවරු ගැන සඳහන් සූත්‍ර
- වැයිහේනේ පඤ්ඤාලෝක හිමි - වෛදික යුගයෙන් බෞද්ධ යුගයට

# 26 පාඩම
## සාසන සංවිධාන සමුළු තුන

**නිපුණතාව:- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින බෞද්ධ ආගමික වත් පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනී.

**නිපුණතා මට්ටම:- 8.2**

- ථෙරවාදී ධර්ම සංගායනාවන්හි ශාසනික වැදගත්කම හැඳින ජීවිතාදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම්පල:-**

1. ථෙරවාදී සංගායනා තුනට අදාළ තොරතුරු මතකයෙන් කියයි.
2. බොහෝ ශාසනික ගැටලු විසඳා ගැනීමට සංගායනා ඉවහල් වන බව පිළිගනිමින් කතා කරයි.
3. ථෙරවාදී සංගායනාත්‍රයෙහි මූලික තොරතුරු වෙන් වෙන් ව වගුගත කරයි.
4. ඇතිවන ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගනී.
5. ධර්මය සුරක්ෂිත කිරීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙර දිනයේ විසිහයවන පාඩමේ එන ''අලං ආවුසො මා සෝචිත්ථ.........'' යන සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය කටපාඩම් කරගෙන එන ලෙස දැනුම් දෙන්න.

**II** ප්‍රවේශය

- ''අලං ආවුසො මා සෝචිත්ථ.........'' යනාදී පාඨය සජ්ඣායනය කර සිසුන් සමඟ ද සජ්ඣායනය කරන්න.
- ඊට අදාළ කතා පුවත විස්තර කරමින් ථෙරවාදී සංගායනා යන්න පිළිබඳව ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ධර්ම සංගායනා යනු කුමක්දැයි පැහැදිලි කර දෙන්න.
- ථෙරවාදී ධර්ම සංගායනා තුනක් මූලිකව පැවැති බව පෙන්වා දෙන්න.
- දෙව්දත් තෙරුන්ගේ පංචවරය සාකච්ඡා කරන්න.
- බුදුරදුන් ධරමාන සමයේ දී ම භික්ෂූන් අතර ගැටලු ඇති වූ බව පෙන්වා දෙන්න.
- බුදුරජාණන් වහන්සේ ද සංගායනා යන වදන භාවිත කරමින් එය කළ යුත්තක් බව පෙන්වා ඇතිබව ද තහවුරු කරන්න.

- පළමු ධර්ම සංගායනාවට අදාළ තොරතුරු විස්තර කරන්න.
- එම සංගායනාවෙන් අත් වූ ප්‍රතිඵල පැහැදිලි කරන්න.
- දෙවන ධර්ම සංගායනාවට අදාළ තොරතුරු විස්තර කරන්න.
- එම සංගායනාවෙන් අත් වූ ප්‍රතිඵල පැහැදිලි කරන්න.
- තුන්වන ධර්මසංගායනාවට අදාළ තොරතුරු විස්තර කරන්න.
- එම සංගායනාවෙන් අත් වූ ප්‍රතිඵල පැහැදිලි කරන්න.
- ධර්මාශෝක රජු හා ධර්මප්‍රචාරය විස්තර කරන්න.
- සංගායනා නිසා ධර්මය සුරක්ෂිත වූ අයුරු පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- බහුශ්‍රැත - බොහෝ ඇසූ පිරූ තැන් ඇති
- අභද්‍ර වචනය - යහපත් නොවූ වචනය
- සිව්පිළිසිඹියා - අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාණ
- මුඛ පරම්පරාවෙන් - කටපාඩමෙන් පවත්වාගෙන ඒම
- බ්‍රහ්මදණ්ඩනය - දඬුවමක් ලෙස අන් අය කතා නොකර සිටීම
- අටළොස් නිකාය - නිකාය දහඅටක්
- දුර්ලබ්ධි - වැරදි ආගමික ප්‍රතිපදා
- විභජ්ජවාදී - බෙදා වෙන්කිරීම

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- ''අලං ආවුසො මා සෝචිත්ථ.........'' යන සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශය ඇතුළත් පුවරුව
- පෙළ පොතේ විසිහයවන පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- ධර්ම සංගානා පිළිබඳ තොරතුරු වගුගත කරයි.
- ධර්ම සංගයනා පැවැත්වීමට හේතු මොනවාදැයි පැහැදිලි කරයි.
- ධර්ම සංගායවන්ගෙන් සිදු වූ ප්‍රතිඵල මොනවාදැයි පෙන්වාදෙයි.
- සාසනයේ උන්නතිය උදෙසා සංගායනාවන්ගෙන් වූ ප්‍රතිඵල පැහැදිලි කරයි.

## වැඩිදුර පරිශීලනයටඃ-

- සුචරිත ගම්ලත් - බෞද්ධ ධර්මසංගායනා
- ශාසන ඉතිහාසය - දහම්පාසල් අවසානය
- කොස්වත්තේ අරියවිමල හිමි - උසස්පෙළ බුද්ධධර්මය

# 27 පාඩම
## බුදු සසුන රජ හසුන කළ අධිරජ

**නිපුණතාව:- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින බෞද්ධ ආගමික වත් පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්ෂා කිරීමට පියවර ගනී.

**නිපුණතා මට්ටම:- 8.3**

- ධර්මාශෝක අධිරාජයාගේ ධර්මදූත සේවය ශාසන චිරස්ථිතියට බල පෑ බව පිළිගෙන ධර්මය ආරක්ෂා කිරීමට කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 08 යි

**ඉගෙනුම්පල:-**

1. ථෙරවාදි ධර්ම සංගායනා තුනට අදාළ තොරතුරු මතකයෙන් කියයි.
2. බොහෝ ශාසනික ගැටලු විසඳා ගැනීමට සංගායනා ඉවහල් වන බව පිළිගනිමින් කතා කරයි.
3. ථෙරවාදි ධර්ම සංගායනාත්‍රයෙහි මූලික තොරතුරු වෙන් වෙන් ව වගුගත කරයි.
4. ඇතිවන ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගනී.
5. ධර්මය සුරක්ෂිත කිරීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙර දිනයේ ''බුදුසසුන රජහසුන කළ අධිරජ'' නමැති විසිහත් වන පාඩම කියවාගෙන ඒමට පන්තියේ සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- සාංචිවිහාරය හෝ අශෝකස්ථම්භය දැක්වෙන ඡායාරූපයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- එම නිර්මාණ ඉදිකළේ කවුරුන්ද යන්න සාකච්ඡා කරමින් අශෝක අධිරාජයා පිළිබඳ කරුණු ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- මෞර්ය රාජවංශය පිළිබඳ තොරතුරු පැහැදිලි කරන්න.
- අශෝක රජු දිග්විජය හැර ධර්මවිජය තුළින් ශ්‍රේෂ්ඨ අධිරාජයකු වූ අයුරුත් පෙන්වා දෙන්න.
- අශෝක ධර්මය බුදුදහමින් ආලෝකවත් වූවක් බව පැහැදිලි කරන්න.
- අශෝක රජුගේ දෙස් විදෙස් ධර්ම ප්‍රචාරක කටයුතු පිළිබඳවත් සාකච්ඡා කරන්න.
- අශෝක ධර්මය පසුකාලීන රජවරුන්ටත් ආදර්ශයක් වූ බව පැහැදිලි කරන්න.

- අසූහාර දහසක් ධර්මස්ඛන්ධයට උපහාර පිණිස අසූහාර දහසක් වෙහෙර විහාර ඉදිකළ බව පෙන්වා දෙන්න.
- අශෝක අධිරාජයාගේ ධර්මප්‍රචාරක සේවාවන් පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාත්මක තොරතුරු මඟින් තහවුරු වන බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- රාජාභිෂේකය - රජකෙනෙක් බවට පත් වීම
- දිග්විජය - යුද්ධයෙන් දිශා ජය ගැනීම
- ධර්මවිජය - ධර්මය දිශාවන්හි පැතිරවීම
- තීර්ථකයන් - බුද්ධ කාලයේ සිටි ආගමික පිරිසක්
- සර්වසාධාරණ - සියලු ආකාරයෙන් ම සාධාරණ වූ
- ශිලාලේඛන - සෙල්ලිපි, ගලේ ලියූ අක්ෂර
- මහාමහේන්ද්‍ර - මිහිඳු මාහිමි
- රණකාමීත්වය - යුද්ධයට ඇති කැමැත්ත

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- සාංචි විහාරය හෝ අශෝකස්ථම්භය දැක්වෙන ඡායාරූපයක්
- පෙළ පොතේ විසි හත්වන පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-**

- අශෝක අධිරාජයාගේ දිග්විජය ප්‍රතිපත්ති පිළිබඳ පැහැදිලි කරන්න.
- ධර්මවිජය යනු කුමක්දැයි විස්තර කරන්න.
- අශෝක ධර්මයෙහි සුවිශේෂී ලක්ෂණ පෙන්වා දෙන්න.
- අශෝකරජුගෙන් ලබාගත හැකි ආදර්ශ 05 ක් නම් කරන්න.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- වල්පොළ රාහුල හිමි - ලක්දිව බුදුසමයේ ඉතිහාසය
- ආනන්ද ගුරුගේ - ධර්මාශෝක ධර්මවිජයෙහි ආභාසය හා ආදර්ශය

# 28 පාඩම
## භික්ෂූන් වහන්සේගේ ආගමික මෙහෙවර

**නිපුණතාව:- 8.0**

- ශාසන ඉතිහාසය හැඳින බෞද්ධ ආගමික වත් පිළිවෙත් හා ඓතිහාසික උරුමය ආරක්‍ෂා කිරීමට පියවර ගනී.

**නිපුණතා මට්ටම:- 8.4**

- ආගමික වත්පිළිවෙත් පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාසයෙන් යුතුව කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම්පල:-**

1. පිරිත් වර්ගීකරණ මතකයෙන් කියයි.
2. සාම්ප්‍රදායික පූජා චාරිත්‍ර, උපචාරවිධි අගයමින් කතා කරයි.
3. එක් එක් පිරිතට අදාළ චාරිත්‍ර හා උපචාරවිධි අනුව කටයුතු කරයි.
4. අවබෝධයෙන් යුතුව පිරිත් දේශනා කරයි.
5. සාම්ප්‍රදායික පූජා චාරිත්‍ර විධි නිවැරදිව පවත්වාගෙන යයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- විසිඅට වන පාඩම කියවා වරුපිරිත, තුන් වරුපිරිත, තිස් පැ පිරිත යනාදී පිරිත් වර්ගීකරණය හා ඒවායේ වෙනස්කම් මොනවාදැයි සටහන් කරගෙන එන ලෙස පෙර දින පන්තියට දැනුම් දෙන්න.

**II** ප්‍රවේශය

- දීඝායු කුමාරයාගේ කතාව පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- පිරිත යන්න ඉස්මතු කරගන්න

**පාඩම් සංවර්ධනය:-**

- පිරිත් වර්ගීකරණය පැහැදිලි කරන්න.
- එම වර්ගීකරණයට අදාළ කොටස් හත විස්තර කරන්න.
- පිරිත්වලට අදාළ චාරිත්‍ර විධි හා උපචාර විධි පෙන්වා දෙන්න.
- පිරිත් මණ්ඩපයක් සැකසීම හා ඊට ආවේණික ලක්‍ෂණ මොනවාදැයි පෙන්වා දෙන්න.
- තිස් පැ පිරිත හා ඊට ආවේණික චාරිත්‍රවිධි පෙන්වා දෙන්න.
- තුන්තිස්පැ, පන්තිස්පැ හා සතිපිරිත් චාරිත්‍ර හා ඊට අදාළ දේ පිළිබඳ සාකච්ඡා කරන්න.
- සිසුන් සහභාගී වූ පිරිත් දේශනාවක් පිළිබඳ තොරතුරු විමසමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

- යුගාසන දේශනා පිළිබඳව විස්තර කර දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- අදෘශ්‍යමාන - ඇසට නොපෙනෙන දේ
- තිස්පැය පිරිත - සිංහල ක්‍රමයට අනුව දිනකට පැය හැටකි. හවස හයේ සිට උදෑසන හය දක්වා පැය 30 කි. එසේ පැය තිහක් දේශනා කරන පිරිත
- තුන්තිස්පැය පිරිත - තිස්පැය තුනක් දේශනා කරන පිරිත. එනම් පැය අනූවක් දේශනා කරන පිරිත
- පන්තිස් පැය - තිස්පැයේ ඒවා පහක්
- තුන්යම් රාත්‍රිය - පෙරයම, මැදියම, අළුයම
- පිරිත් හුය - පිරිත් නූල
- දේවදූතයා - දෙවියන්ට දූත මෙහෙවර කරන්නා
- ප්‍රදක්ෂිණා කිරීම - ස්වකීය දකුණු අත පූජනීය වස්තුවක් දෙසට සිටන සේ තෙවරක් ගමන් කිරීම. (පැදකුණු කිරීම)
- වජ්‍රාසනය - බුද්ධත්වය ලැබීමේ දී වැඩ සිටි ආසනය හෙවත් විදුරසුන

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- පෙළ පොතේ විඩිඅට වන පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-**

- එක් එක් පිරිතට අදාළ ආවේණික චාරිත්‍ර හා උපචාර විධි පැහැදිලි කරන්න.
- ඒ ඒ පිරිත් වර්ග අනුව පවත්නා වෙනස්කම් පෙන්වා දෙන්න.
- පිරිත් මණ්ඩපයක තිබිය යුතු අංග නම් කරන්න.
- දොරකඩ අස්න හා අනුශාසනා අස්න දේශනාව හා අදාළ තොරතුරු පැහැදිලි කරන්න.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නාහිමි - පිරුවාණා පොත් වහන්සේ
- අත්තුඩාවේ සිරි රාහුල මහනාහිමි - පිරුවාණා පොත් වහන්සේ

# 29 පාඩම
## බුදු දහමින් හැදී වැඩුණු සිංහලය

**නිපුණතාව:-9.0**

9. සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, සහජීවනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොටගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනී.

**නිපුණතා මට්ටම:- 9.1**

4.9.1. බෞද්ධ ඉගැන්වීම් අනුව භික්ෂු ජීවිතය සාර්ථක කර ගනිමින් ශාසනික අභිවෘද්ධියෙහි යෙදෙයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම් ඵල:-**

1. බුදුදහමින් පෝෂිත හෙළ සංස්කෘතිය පැහැදිලි කරයි.
2. මහින්දාගමනයෙන් පසු හෙළ සංස්කෘතියේ හරවත් පරිවර්තනයක් සිදු වූ බව පිළිගනිමින් ක්‍රියා කරයි.
3. උපතේ සිට මරණය දක්වා පුද්ගල ජීවිතයේ පවත්වන ඒ ඒ ආගමික චාරිත්‍ර විධි ගොනු කරයි.
4. සංස්කෘතික උරුමයන් රැකගැනීමට ක්‍රියා කරයි.
5. බුදුදහමින් ඔපවත් වුණු සිංහල සංස්කෘතික චාරිත්‍ර විධි නිවැරදිව පවත්වාගෙන යයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙර දිනයේ විසිනව වන පාඩම වන ''බුදුදහමින් හැදී වැඩුණු සිංහලය'' නමැති පාඩම කියවාගෙන එන මෙන් සිසුන් දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන තේමාව යටතේ ඇඳි චිත්‍රය සහිත පුවරුව පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.
- බුදුදහමින් හැදී වැඩුණ සිංහලය යන අරුත ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- අපේ ඉතිහාසය වසර 2500 කට වඩා ඈතට දිවයන බව පෙන්වා දෙන්න.
- ගසට පොත්තත් පොත්තට ගසත් මෙන් සිංහලයා හා බෞද්ධාගම බැඳී ඇති බව පැහැදිලි කරන්න.
- උපතේ සිට මරණය දක්වා ජීවිතයේ සුවිශේෂී සෑම අවස්ථාවකට ම බෞද්ධාගමික වත් පිළිවෙත් අනුගමනය කරන බව පෙන්වා දෙන්න.

- බෞද්ධයන් කෘෂි කර්මාන්තය වැනි දැහැමි ජීවන වෘත්තීන් පදනම් කරගත් පිළිවෙතක් අනුගමනය කරන බව විස්තර කරදෙන්න.
- සිංහල සාහිතය ද බුදුදහමෙන් ම පෝෂිත බව පෙන්වා දෙන්න.
- සෑම කලා ශිල්පයක් ම බුදුදහමේ ආභාෂයෙන් නිර්මාණය වී ඇතිබව විස්තර කරන්න.
- බුදුදහම බොහෝ කල් පැවතීමෙන් බෞද්ධ කලා ශිල්පයන් ද බොහෝ කල් සුරක්ෂිතව පවත්නා බව පෙන්වා දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- මිථ්‍යා විශ්වාස - වැරදි විශ්වාසය
- සමානාත්මතාව - සැමට සමානව සැලකීම
- ප්‍රාග් බෞද්ධ - බුද්ධ කාලයට පෙර
- බෝධිසත්ත්ව ගුණෝපේත - බෝසත් ගුණ ඇති
- ක්‍රිස්තු පූර්ව - ක්‍රිස්තුස් වහන්සේ ඉපදීමට පෙර
- සුසංවිධිත - මනාව සංවිධානය කළ
- සිංහාසනය - රජුගේ ආසනය
- බ්‍රාහ්මණාගම - බමුණු ආගම
- සියවස - වසර සියයක්

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන තේමාව යටතේ ඇඳි චිත්‍රයක්
- පෙළ පොතේ විසි නවය පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා කත්සේරු කරන නිර්නායකඃ-**

- ''මහින්දාගමනය සිංහල සංස්කෘතියේ ආරම්භයයි'' මේ පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න.
- භික්ෂූන් වහන්සේ සිංහල ජන සමාජයේ කුල දේවතාවුන් ලෙස හැඳින්වූයේ කුමක් නිසා ද?
- උපතේ සිට මරණ දක්වා වූ පුද්ගල ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් හි සිදුකරන බෞද්ධ චාරිත්‍ර මොනවාද?
- වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන මාතෘකාව ඔස්සේ රචනයක් ලියන්න.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- වල්පොළ රාහුල හිමි - ලක්දිව බුදුසමයේ ඉතිහාසය
- බද්දේගම විමලවංස අනුනාහිමි - අපේ සංස්කෘතිය

# 30 පාඩම
## ලොවට වඩන මෙත හා සතට සදන සෙත

**නිපුණතාව:-9.0**

- සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහජීවනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොටගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගනී.

**නිපුණතා මට්ටම:-**

- බෞද්ධ ඉගැන්වීම් අනුව භික්ෂු ජීවිතය සාර්ථක කර ගනිමින් ශාසනික අභිවෘද්ධියෙහි යෙදෙයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම්පල:- 9.1**

1. සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු අර්ථ සහිතව පවසයි.
2. උතුම් ජීවිතයක් ගතකිරීමට සතර බ්‍රහ්ම විහරණ හේතුවන බව පිළිගෙන කටයුතු කරයි.
3. සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු අතර වෙනස පැහැදිලි කරයි.
4. මෙකී ඉගැන්වීම් ජීවිතයට සම්බන්ධ කරගෙන ක්‍රියා කරයි.
5. මෙම ඉගැන්වීම් අන්‍යයන්ට ද වටහා දෙමින් ක්‍රියාවෙහි යෙදවීමට ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,
- පෙර දිනයේ තිස් වන පාඩමෙහි සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු අර්ථ සහිතව ලියාගෙන එන ලෙස දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය
- සිසුන් ලියාගෙන ආ දේ පිළිබඳ විමසමින් ඒවා කළුලෑල්ල මත ලියන්න.
- මේ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවමින් සතර සංග්‍රහ වස්තු හා සතර බ්‍රහ්මවිහරණ ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු අතර වෙනස පැහැදිලි කර දෙන්න.
- මෙත්තා යන්න පැහැදිලි කරන්න.
- කරුණා යන්න පැහැදිලි කරන්න.
- මුදිතා යන්න පැහැදිලි කරන්න.
- උපෙක්ඛා යන්න පැහැදිලි කරන්න.
- දානය යන්න පැහැදිලි කරන්න.
- ප්‍රියවචනය යන්න පැහැදිලි කරන්න.
- අර්ථචරියාව යන්න පැහැදිලි කරන්න.

- සතර බ්‍රහ්ම විහරණ හා සතර සංග්‍රහවස්තු ජීවිතයට ප්‍රයෝජනවත් වන අයුරු සාකච්ඡා කරන්න.
- සමානාත්මතාව යන්න සාකච්ඡාවට ලක්කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- පරදුක්ඛේ - අනුන්ගේ දුක
- කම්පනං - කම්පාවීම
- සාධූනං - සත්පුරුෂ
- සමූහචාරී - කණ්ඩායමක් ලෙස හැසිරෙන
- ආත්මාර්ථය - තමා පිළිබඳ පමණක් සිතීම
- පරාර්ථය - අනුන් පිළිබඳව සිතීම.
- සේවනා - ඇසුරු කිරීම

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- පෙළ පොතේ තිස්වන පාඩම.
- ගුරු මාර්ගෝපදේශය

## ඇගයීම් හා කත්සේරු කරන නිර්ණායකඃ-

- සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු තේරුම් සහිතව පිළිවෙළින් කියන්න.
- සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු විස්තර කරන්න.
- සතර බ්‍රහ්මවිහරණ හා සතර සංග්‍රහවස්තු සමාජයට වැදගත් වන අයුරු පෙන්වා දෙන්න.
- බෞද්ධයන් පමණක් නොව ලොව සෑම දෙනාට ම සතර බ්‍රහ්ම විහරණ හා සතර සංග්‍රහවස්තුවල ඇති ප්‍රයෝජනය පහදන්න.

## වැඩිදුර පරිශීලනයටඃ-

- සිඟාලෝවාද සූත්‍රය හා එහි අටුවාව
- මාපලගම සෝමිස්සර හිමි - බුද්ධ ධර්මය

# ත්‍රිපිටක ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෙ ා්පදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වනඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම් ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරය යි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමකින් සාක්ෂාත් වූයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතුය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයයි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන්

යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

| | |
|---|---|
| 1. පැවරුම් | 2. ව්‍යාපෘති |
| 3. සමීක්ෂණ | 4. ගවේෂණ |
| 5. නිරීක්ෂණ | 6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 7. ක්ෂේත්‍ර චාරිකා | 8. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්වනිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නල |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.